**2026-03-10 බළන්ගොඩ ප්‍රාදේශිය සභා**
**මාසික මහා සභා රැස්වීමේ**
**සංක්ෂිප්ත වාර්තාව**

2026 මාර්තු මස 10 වන දින පෙ.ව.10.00ට බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

**සහභාගිත්වය :**

1. ගරු සභාපති - ගමඇතිගේ ආරියදාස මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බී.ගුණරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.නන්දසිරි මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.කේ.අජිත් ප්‍රියන්ත මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.දර්මදාස මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ර්.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ශ්‍රියානි මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.අසෝක්කුමාර් මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.රෝහණ පුෂ්පකුමාර මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය

**සහභාගි නොවු :-**

1. ගරු උපසභාපති - බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය

**01.පසුගිය සභා වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපිට න්‍යාය පත්‍රයේ මුලින්ම තියෙන්නේ පසුගිය පෙබරවාරි මස මහා සභා වාර්තාව හා පෙබරවාරි මස විශේෂ මහා සභා වාර්තාව සම්මත කිරීම. ගරු මන්ත්‍රීතුමෙක් හෝ තුමියෙක් ඉදිරිපත් වෙලා එම වාර්තා සංශෝධන තියෙනවනම් සංශෝධන සහිතව සභා සම්මත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**

සභාපතිතුමනි මං එදා කිව්වේ අපේ කොට්ඨාශයේ මහජන ආරක්ෂක කමිටුව පත් කරලා තියෙනවා කියලා. නමුත් මං කිව්වේ අපේ කට්ටිය 35 ක් 36 ක් විතර ෆොටෝ රු.300/=ක් දීලා ගත්තා කියලා. ඒකේ රු.300/=කියන එක නැහැ. මේකේ උස්වත් කියලා නම දාලා තියෙනවා. ඒක මම භාවිතා කරපු නමක් නෙමෙයි තියෙන්නේ. ඒක සනුස්දීන් කියලා නිවැරදි වෙන්න ඕනි. අනික මම කිව්වේ අපේ කොට්ඨාශයේ භාරව ඉන්න පොලිස් මහත්තයා තමයි බෝපිටිය මහත්තයා කියලා. මේකේ තියෙනවා එයාගේ වැඩක්ද දන්නේ නැහැ කියලා. මම එහෙම සඳහන් කළේ නැහැ. මම කිව්වේ බෝපිටිය මහත්තයාට තමයි භාර දුන්නේ කියලා. ඒ ෆොටෝ දෙකට මොනවද වුණේ කියලා දන්නේ නැහැ කියලා තමයි මම කිව්වේ. ඒ ටික සංශෝධනය වෙන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මං කිව්ව එකේ පොඩි අඩුවක් තියෙනවා. වහරත්ගොඩ වෙල්යායට හියුම් පයිප්ප ලබා දීම කියන එකේ මේකේ තියෙන්නේ මහරත්යාය කියලා. ඒක නිවැරදි වෙන්න ඕනි වහරත්ගොඩ වෙල්යාය කියලා. එච්චරයි තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බී.ගුණරත්න මැතිතුමා**

සභාපතිතුමා, ගියවර සභාවේ 06-02 යෝජනාවේ ආහාර මලු බෙදා දීමේ වැඩසටහනට අදාළව වෙන් කරලා තියෙන මුදල සභා තීරණේ තුළ නිවැරදිව සටහන් වෙලා තිබුණත්, සභාපතිතුමා අදහස් දක්වන කොටස තුළ රු.10000.00 ක් විදියට තමයි වාර්තාවේ සටහන් වෙලා තියෙන්නේ. නමුත් ඒකට වෙන් කරලා තියෙන මුදල රු.100000.00 ක්ලෙස නිවැරදිව සංශෝධනය වෙන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා**

පසුගිය මහා සභා වාර්තාව සංශෝධන සහිතවත්, විශේෂ මහා සභා වාර්තාව සංශෝධන රහිතවත් සභා සම්මත කිරීමට අදාළ යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව පසුගිය මස මහා සභා වාර්තාව සංශෝධන සහිතව සහ විශේෂ මහා සභා වාර්තාව සංශෝධනවලින් තොරව සභා සම්මත කිරීම සුදුසු බව මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**02.සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කළ යුතු නිවේදන**

අද අපි රටක් ලෙස මුහුණ දීලා තියෙන්නේ අපේ රටේ ප්‍රශ්නෙකට නෙවෙයි. සභාව විදියට අපි බලන්ගොඩ ප්‍රාදේශීය සභාව තුළ සිටින ජනතාවගේ ජන ජීවිතයට යම් බලපෑමක් වෙන නිසාම අපිට මේ සභාව තුළ කතාබහ කරන්න වෙන කාරණයක් සම්බන්ධව තමයි මම මතු කරන්න උත්සාහ ගන්නේ. එකක් තමයි අපි රටක් විදියට මුහුණ දෙන ප්‍රශ්නයක් නෙවෙයි අපිට තියෙන්නේ. ඒ කියන්නේ මැදපෙරදිග ඇතිවෙලා තියෙන, ඒ ඇවිලීගෙන යන යුද්ධය නිසා ඊයේ අපිට රජයක් විදියට සිද්ධ වුණා ඉන්ධන මිල වැඩි කරන්න. ලෝකේ අනිත් රටවල් ගත්තමත් සෑම රටකම වගේ මේක බරපතල ලෙස ප්‍රශ්නයක් බවට පත්වෙලා තියෙනවා. ඇත්තටම මේ යුද්ධය කියන එකට අපි එක පාර්ශවයක්වත් කැමති නෑ. අපි කැමති සාමයට. අපට ඕන ලෝක සාමයක් වෙනුවෙන් කටයුතු කරන්න. වර්තමාන රජයත්, කටයුතු කරමින් ඉන්නේ සාමය පැත්තෙන් මිසක්කා පාර්ශවයක් අරගෙන නෙවෙයි. අපිට ඒ යුද්ධයට මැදිහත් වෙච්ච ඒ දෙපාර්ශවයෙන් මොන පැත්තක්වත් අපි ගන්නේ නැහැ. අපිට ඕන සාමය. ලෝකය ඉල්ලා සිටින්නේ සාමය. අපි දන්නවා ඇත්තටම මේක කිසිම තේරුමක්

නැති යුද්ධයක් කියලා. සම්පත් බෙදා ගැනීම වෙනුවෙන් ලෝකේ කරන යුද්ධයක් මේක. අපි දන්නවා වසර තුන්ලක්ෂ පහළොස්දාහකට පමණ කලියෙන් මානව විද්‍යාඥයෝ උපකල්පනය කරන විදියට අපි එකම මූලයකින් පැවතගෙන ආපු කණ්ඩායමක්. අප්‍රිකානු මහද්වීපයේ මුළු ලෝකෙම අපි ව්‍යාප්ත වුණා. ඒ මොහාත වෙනකොට මුලින්ම අපි මානවයින් අපි හදාගත්තු සමාජ, ආර්ථික ක්‍රමය තමයි ප්‍රාථමික සාමූහික සමාජය. මේ ප්‍රාථමික සාමූහික සමාජය තුළ සමාජ පන්ති නෑ. දේපළවලට ආරවුල් නෑ, යුද්ධ නෑ, මිනිස්සු විසින් මිනිස්සු මරා ගන්නේ නෑ. අද අපිට නොවුණත් අපිට විශාල වේදනාවක් තියෙනවා මේ රටවල් ඇත්තටම මිනිස් ජීවිත විනාශ කරන එක ගැන. ඊට පස්සේ මොකද වුණේ ඉතිහාසයේ ඉතාම අභාග්‍යවන්ත සිදුවීමක් සිද්ධ වෙනවා , සාමූහිකව ජීවත් වෙච්ච අය සමාජ පන්තීන් වලට බෙදෙනවා . ඒ ප්‍රථම පන්ති සමාජය තමයි වහල් සමාජය. එතැන් සිට මොකද වෙන්නේ දේපළවලට මේ එකම මූලයකින් පැවතගෙන එන එකම මිනිස් කණ්ඩායම මරාගෙන මැරෙන මට්ටමට එනවා දේපළ හේතු කොට ගෙන මනුස්සකම පැළ දොරෙන් පැනලා යනවා. අන්න එවැනි තත්ත්වයක් තමයි අද ලෝකේ තියෙන්නේ.

ඒ නිසා අපි පුංචි සභාවක් වෙන්න පුළුවන්. පළාත් පාලන ආයතන කියලා කියන්නේ පහළම ආයතනයක් වෙන්න පුළුවන්. නමුත් අපි මේ සභාවෙන් අපි සියළු දෙනාම ඒ කියන්නේ මේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා සියළු දෙනාම අපි එක හඬින් ප්‍රකාශකර සිටින්නේ අපට සාමය අවශ්‍යයි ලෝකයේ ඉස්සරහට යන්න. අන්න ඒ වෙනුවෙන් අපි සියළු දෙනාම එක හඳින් ප්‍රාර්ථනා කරන්නේ ඉක්මනින්ම සාමය උදා වේවා ලෝකයට. ඒ වගේම මේ මුහුණ දීලා තියෙන තත්ත්වය පිළිබඳවත් අපේ රට විදියට, අපිට දැන් තෙල් ප්‍රශ්නේ වැඩි වුණා, පහුගිය දවස්වල හිතුවේ නැති විදියට තෙල් පෝලිම් දවස් 02ක් විතර ඇතිවුණා. රජය ඉතාමත් කාර්යක්ෂම ලෙස දවස් 02ක් වගේ ඉතාම කෙටි කාලයක් තුළ ඒ පෝලිම් නැති කළා. විවිධ මාධ්‍යයන්වලින් විවිධ බොරු ප්‍රචාර අරගෙන ගියත්, අපේ රටේ ජනතාව අපි ජනශ්‍රැතියෙත් අහලා තියෙනවා ගිනිපෙනෙල්ලෙන් බැට කාපු මිනිහා කණාමැදිරි එළියටත් බයයි කියලා. ඒ නිසා තෙල් පෝලිම් ඇති වුණා. රජය පුන පුනාම කිව්වා තෙල් අර්බුදයක් නෑ, ඕනි තරම් තෙල් තියෙනවා අපි අප්‍රේල් මාසෙ වෙනකම් තෙල් සංචිත ගෙනල්ලා තියෙනවා , අපි ඇණවුම් කරලා තියෙනවා , ඒක නිසා කිසිම කෙනෙක් පෝලිම්වල රැදෙන්න එපා කියලා. අවසානයේ අපේ රටේ ඒ දේශප්‍රේමී ජනයා ඒ රජයේ නිවේදනවලට ඇහුම්කම් දීලා ඉවරවෙලා අවසානයේ පෝලිම් අහෝසි වුණා. ඒක නිසා අපිට ඕනකම තියෙන්නේ අපි ඒ ආදර්ශය දෙන්න ඕනි. අපේ රටේ සිංහලද, දෙමළද, මුස්ලිම්ද කියලා නැහැ. අපි එක මවකගේ දරුවන් ලෙසින් අවසානයේ ලාංකීය ජනතාව නියෝජනය වන ලෙසින් අපි වැඩ කරන්න ඕනිකම තියෙනවා.

ඒ විතරක් නෙවෙයි අපේ දේශපාලන භේදත් නෑ. මං හැමදාම කිව්වා, මං මේ පුටුවට ආපු දවසෙත් කිව්වා අපි ලොකු ආදර්ශයක් සපයලා තියෙනවා භාවිතාවෙන්. අපි කිසිඳු දේශපාලන පක්ෂයකින් පළි ගන්නේ නැහැ. ඒක අපි භාවිතාවෙන් ඔප්පු කරලා තියෙනවා. ඒ වගේම අපේ රට ඉතාමත්ම දරුණු ව්‍යවසනයකට මුහුණ දීලා තියෙනවා විෂ මත් ද්‍රව්‍ය. ඒක නිසා මෙතන ඉන්න බොහෝ දෙනෙක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂ මත්ද්‍රව්‍ය විරෝධි සංවිධානය හැදුවා. ඒ සංවිධානයට අපි සභාවක් ලෙස ක්‍රියාකාරීව සම්බන්ධ වෙමු. ඒක නිසා අපේ අනාගත තරුණ පරම්පරාව මේ විෂ මත්ද්‍රව්‍යයෙන් අපි බේර ගන්න ඕනි. ඒ විෂ මත් ද්‍රව්‍ය කමිටුවේ මම ඉතා කෙටි අදහස් දැක්වීමක් ඉදිරිපත් කළා. විවිධ ආයතනවලින් මත්ද්‍රව්‍ය තියෙන ඒ ආදීනව පිළිබඳව අදහස් ඉදිරිපත් කළා. ඒක ඒ තරම්ම බරපතල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබුණා. අර මගේ කෙටි අදහස් දැක්වීමේදී මම කිව්වා අපේ ජනශ්‍රැතියේ තියෙනවා ඔවා දෙනු පරහට තමා සම්මතයෙහි පිහිටා සිට කියලා. ඒක නිසා අපි ඒ අවවාද පිළිගන්නේ නැත්තම් ඒවායේ වලංගුභාවයක් ඇති වෙන්නේ නැහැ. ඒ ජනශ්‍රැතියේ එන ඒ පාඨය එන්නේ ධම්ම පදයේ පණ්ඩිත වග්ගයේ එන 158 වෙනි ගාථාවේ තමයි සර්වඥයන් වහන්සේ එසේ දේශනා කරලා තියෙන්නේ. එදා සමහර භික්ෂූන් හිටියා ඒ භික්ෂූන් වහන්සේලා දුස්ශීලව හැසිරුණා. අපේ සර්වඥයන් වහන්සේ ඔවුන්ට අවවාද දුන්නා . ඒ අනුසාරයෙන් තමයි මේ ගාථාව නිර්මාණය වෙලා තියෙන්නේ. ඒක නිසා අපිට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විදියට අපි ඒකට උර දෙන්න ඕනි, ඒවට නායකත්වය දෙන්න ඕනි, ඒ වෙනුවෙන් අපි කැප කිරීම් කරන්න ඕනි. ඒක නිසා අපි ඒ විෂ මත් ද්‍රව්‍ය තුරන් කරන්න අපි ආදර්ශයෙන් වගේම , අවවාද දීලා අපේ සභා බල ප්‍රදේශය තුළ තම තමන්ගේ කොට්ඨාශවල , තමන්ගේ වසම්වල , තම තමන්ගේ යාළු මිත්‍රාදීන්ටත්, මේක කියලා දීලා අපි අපේ අනාගත පරම්පරාව

ආරක්ෂා කරගමු. අන්න ඒ සඳහා අපි සියළු දෙනාටම දැනුම, හැකියාව, ශක්තිය, ආත්ම පරිත්‍යාගය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ මේ කෙටි අදහස් දැක්වීම අවසන් කරනවා.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
අද දින සභා රැස්වීමට සම්බන්ධ වෙන්න විදියක් නැහැ කියලා ධනුෂ්ක නන්දසිරි මැතිතුමා නිවාඩු ඉල්ලුම් කරලා ලිපියක් සභාගත කරලා තියෙනවා. එතුමාගේ නිවාඩු අනුමත කරලා දෙන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන් කුමාර මැතිතුමා**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
ඒ වගේම අපේ ජගත් නිලන්ත මන්ත්‍රීතුමාට අද සභාවට පැමිණෙන්න විදියක් නැහැ කියලා නිවාඩු ඉල්ලුම් කරපු ලිපියක් සභාගත කරලා තියෙනවා. එතුමාගේ නිවාඩු අනුමත කරලා දෙන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා මැතිතුමා**
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය**
වජිරා මන්ත්‍රීතුමියට අද අසනීප තත්ත්වයේ පසුවෙන නිසා එන්න විදියක් නැ කියලා නිවාඩු ලිපියක් සභාවට එවලා තියෙනවා. එතුමියගේ නිවාඩුව සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව ගරු උප සභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනියගේ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**04.මාසිකව සභාවට ලැබී ඇති ලියුම් ,පෙත්සම්,පැමිණිලි,සංදේශ හා නිවේදන ඉදිරිපත් කිරීම**
ඉදිරිපත් වී නැත

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** - ඉදිරිපත් වි නැත.

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**06-01 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වරිපනම් බදු ලේඛනයේ නම සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව (ආර්.ඩී.රුවන් චාමර වික්‍රමසිංහ මහතා)**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
මේ යෝජනාවේ තියෙන බළන්ගොඩ රත්නපුර පාරේ වරිපනම් අංක 1494/1 දරන දේපළ ආර්.ඩී.රුවන් චාමර වික්‍රමසිංහ මහතාගේ නමින් සංශෝධනය කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ සඳහා ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් බළන්ගොඩ රත්නපුර පාරේ වරිපනම් අංක 1494/1 දරන දේපළ ආර්.ඩී.රුවන් චාමර වික්‍රමසිංහ මහතාගේ නමින් සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-02 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වරිපනම් බදු ලේඛනයේ නම සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව (ටී.එම්.ජයසේන මහතා)**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
මේ යෝජනාවෙත් බළන්ගොඩ කල්තොට පාරේ වරිපනම් අංක 1099 දරන දේපළ ටී.එම්.ජයසේන මහතාගේ නමින් සංශෝධනය කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ සඳහා ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් කල්තොට පාරේ වරිපනම් අංක 1099 දරන දේපළ ටී.එම්.ජයසේන මහතාගේ නමින් සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-03 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වරිපනම් බදු ලේඛනයේ නම සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව (මොහොමඩ් රාෆික් මහතා)**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
මේකත් අර වගේමයි. බළන්ගොඩ වැලිගෙපොල පාරේ වරිපනම් අංක 65 දරන දේපළ මොහොමඩ් රාෆික් මොහොමඩ් සියාම් මහතාගේ නමින් සංශෝධනය කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ සඳහා ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් වැලිගෙපොල පාරේ වරිපනම් අංක 65 දරන දේපළ මොහොමඩ් රාෆික් මොහොමඩ් සියාම් මහතාගේ නමින් සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-04 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ඩී.නෙත්මි මියැසිකා ශිෂ්‍යාවට (විශ්ව විද්‍යාල අභ්‍යාසලාභී) බළන්ගොඩ ප්‍රාදේශීය සභාව තුළ මාස 03ක ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
විශ්ව විද්‍යාල අභ්‍යාසලාභී ඩී.නෙත්මි මියැසිකා ශිෂ්‍යාවට මාස 03ක කාලයක් අපේ සභාවේ ප්‍රායෝගික පුහුණුව ලබා ගන්න අවස්ථාව දෙන්න කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඒ අනුව අපි මේකට ගරු සභාවේ අනුමැතිය ලබා ගෙන පළාත් පාලන කොමසාරිස්තුමා මගින් ප්‍රධාන ලේකම්තුමාගේ අනුමැතිය යවන්න ඕනි සභා තීරණෙත් එක්ක. ඒ නිසා මේකට ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව ඩී.නෙත්මි මියැසිකා ශිෂ්‍යාවට මාස 03ක කාලයක් බළන්ගොඩ ප්‍රාදේශීය සභාව තුළ ප්‍රායෝගික පුහුණුව ලබා දීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස් මගින් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය සහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-05 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම සම්බන්ධව දැන්වීම් පුවරු සකස් කර සවි කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපේ බළන්ගොඩ සහ කල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සංචාරක ආකර්ශනය දිනාගත්තු පොදු ස්ථාන රාශියක් තියෙනවා. එතකොට රත්නපුර දිස්ත්‍රක්කය ගත්තම සංචාරක කලාප 04කට වෙන් කරලා තියෙනවා. අපි ඒකෙන් අයිති වෙන්නේ බෙලිහුල්ඔය කියන සංචාරක කලාපයට. එතකොට දේශීය වගේම විදේශීය සංචාරකයෝ විශාල වශයෙන් මේතැන්වලට එනවා. එතකොට මේ සමහර තැන් තියෙනවා කසළ විධිමත්ව බැහැර කරන්නේ නැහැ. වතුර බොන්න බෝතලයක් ගත්තම එක්කෝ ඒක බෑග් එකේ දාගෙන යන්නේ නැහැ, නැත්තම් ඩස්ට්බින් එකකට දාන්නේ නැහැ.ඒක විසි කරලා දාලා එනවා. ඒක නිසා අත්තටම ඒකේ අපිළිවෙලක් තියෙනවා. ඒක නිසා සභාවේ වගකීම තියෙනවා, යුතුකමක් තියෙනවා මුලින්ම මේ පිළිබඳව ජනතාව දැනුවත් කරන එක. ඒ නිසා මේ පොදු ස්ථානවල අපද්‍රව්‍ය බැහැර කිරීමට අවශ්‍ය අවවාදාත්මක දැන්වීම් පුවරු සකස් කරලා ප දර්ශනය කරන්න වෙනවා. ඒ අනුව 3*2 ප්‍රමාණයේ අවවාදාත්මක දැන්වීම් පුවරු විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට යටත්ව මුද්‍රණය කිරීමට අපට මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව පොදු ස්ථානවල අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාළ අවවදාත්මක දැන්වීම් පුවරු 3*2 ප්‍රමාණයෙන් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවළිය අනුව මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය සහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-06 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන වැසිකිළි ආධාර ලබා දීම - 2026 වැඩසටහන යටතේ අඩුආදායම්ලාභී එච්.එන්.එස්.වසන්ත ගුණතිලක මහතාට වැසිකිළි ආධාර ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපිට වර්ෂයකට එක වැසිකිළි ආධාරයක් තමයි දෙන්න පුළුවන් වෙන්නේ. අපි ඒකට තෝර ගෙන තියෙන්නේ බළන්ගොඩ, වඩුකන්ද, ඇල්ලෙපොලෙ, අංක 333/1ලිපිනයෙහි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංකයත් තියෙනවා මේකේ, එච්.එන්.එස්.වසන්ත ගුණතිලක මහතා අඩු ආදායම්ලාභියෙකු බවත්, දැනට වැසිකිළියක් නොමැති බවත්, වැසිකිළියක් ලබා දීම සුදුසු බවත්, ග්‍රාම නිළධාරි විසින් තහවුරු කරලා තියෙනවා. ඒ අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමනුත් මේ අයට වැසිකිළියක් ලබා දීම සුදුසුයි කියලා නිර්දේශ කරලා තියෙනවා. එතකොට 2026 වර්ෂයට වැසිකිළි ආධාර ලබාදෙන්න රු.50000/=ක මුදලක් වෙන් කරලා තියෙනවා. අපිට මේ වැසිකිළි ආධාරය ලබා දෙන්න ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය අවශ්‍ය වෙනවා. ඒ අනුව මෙම යෝජනාව ගරු ආණ්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කරන්න අපිට මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා. අත්තටම මෙතෙන්දි අපේ සෞඛ්‍ය පහසුකම් දියුණු වුණාට තවමත් වැසිකිළි නොමැති අය අපේ බළන්ගොඩ බල ප්‍රදේශයේ වගේම රටේමත් ඉන්නවා.

- ඒ අනුව 2026 වර්ෂයේ වැසිකිළි ආධාර සඳහා වෙන් කර ඇති රු.50000/=ක මුදල බළන්ගොඩ, වඩුකන්ද, ඇල්ලෙපොලෙ, අංක 333/1ලිපිනයෙහි පදිංචි, එච්.එන්.එස්.වසන්ත ගුණතිලක මහතාට ලබා දීම සුදුසු බව මහජන සෞඛ්‍ය පරික්ෂක විසින්ද නිර්දේශ කොට ඇති බැවින්, ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවීම සඳහා අවශ්‍ය සහා අනුමැතිය ලබා දීමට මහා සභා ඒකමතිකව තීරණය කරන ලදී.

**06-07 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුර ඉදිරියේදී පුරප්පාඩු වීම හේතුවෙන් නව බඳවා ගැනීමකට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
අපේ දැන් ඉන්න වැඩ කේෂ්ත්‍ර කම්කරු මහතෙකු විශ්‍රාම යන නිසා මේ තනතුර පුරප්පාඩු වෙනවා. එතකොට මේකට ඉදිරියේදි කෙනෙක් බඳවා ගන්න නම් සභාවේ අනුමැතියක් අරන් යෝජනාව සම්මත කරගෙන ඉන්න වෙනවා. ඊට පස්සේ නව බඳවා ගැනීමකට ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගන්න වෙනවා. ඒකට සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව පුරප්පාඩු වැඩ කේෂ්ත්‍ර කම්කරු තනතුරට, නව බඳවා ගැනීමක් සිදු කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවීමට අවශ්‍ය සහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-08 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධන මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම යටතේ,බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි සඳහා සූර්ය පැනල සවි කිරීමට අදාළව සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාව සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
අත්තටම අපි සාකච්ඡාවට භාජනය කරලා තිබුණා එකක් අපිට ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස සූර්යය පැනල සවි කිරීම. හරි පහසුයි ඒක අපිට. අපි යෝජනා කර ගත්තා මේ ගොඩනැගිල්ලට කිලෝ වොට් 60 යි, අපේ ආදාහනාගාරෙට කිලෝ වොට් 30 යි, වෙළිඹයට කිලෝ වොට් 80යි. මේ සම්බන්ධයෙන් පළාත් පාලන නියෝජ්‍ය ඇමතිතුමාගේ සහභාගිත්වයෙන් සාකච්ඡාවක් තිබුණා සබරගමුව පළාත් සභාවේ. ඒකට මමත්, අපේ ලේකම් මිසුත්, සම්බන්ධ වුණා. මොකද වර්තමාන රජය පළාත් සභාවට ආදායම් උත්පාදනය කර ගන්න ප්‍රාග්ධන මුදල් විශාල ලෙස වෙන් කරලා තියෙනවා. ඒ වෙන් කරන කොට දේශපාලන පක්ෂ භේදයකින් තොරව හැම සභාවකටම වෙන් කරලා තියෙනවා. අපේ දිස්ත්‍රික්ක දෙකේම පළාත් පාලන ආයතනවල ප්‍රධානින් සම්බන්ධ වෙලා හිටියා. අපිට පොඩි ගැටලුවක් තිබුණා විදුලි බල මණ්ඩලෙන් තීන්දුවක් අරගෙන තියෙනවා කිලෝ වොට් 05යි දෙන්නේ කියලා. හැබැයි අපි අමාත්‍යාංශයත් එක්ක කතා කළාම අමාත්‍යාංශයෙන් අපිට කිව්වා ඒක වැඩි කරන්න පුළුවන් කියලා මේවා රාජ්‍ය ආයතන නිසා. එතකොට මේ ප්‍රාග්ධන මුදල් ප්‍රදානය කරන්නේ ඒ ඒ පළාත් පාලන ආයතනවල කාර්ය සාධන මට්ටම් අනුව.මේකේදී අපි අයිති වෙන්නේ මධ්‍යම කාර්ය සාධන මට්ටමක් තියෙන පළාත් ආයතනවලට. එතකොට මේ ආයතනවලට රු.මිලියන 12.5 - රු.මිලියන 25 දක්වා තමයි ප්‍රාග්ධන ප්‍රදාන ලබා දෙන්නේ. ඒ අනුව මේ ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන අමාත්‍යාංශය මගින් අපට රුපියල් මිලියන 19ක මුදලක් ලබා දෙනවා. අපි සභා අරමුදලින් රුපියල් මිලියන 02ක පමණ මුදලක් යොදවනවා. ඒ අනුව අපි මේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 21 ක

පමණ දළ ඇස්තමේන්තුවකට සකස් කරලා තියෙනවා. එතකොට අපිට මේක ක්‍රියාත්මක කරන්න සභාවේ අනුමැතියක් ලබා ගන්න වෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධන මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම යටතේ,බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි සඳහා සූර්ය පැනල සවි කිරීමට අදාළව සකස් කරන ලද ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-09 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධන මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම යටතේ,දූවිලිඇල්ල නැරඹුම් ස්ථානය සකස් කිරීම සහ සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සකස් කරන ලද ව්‍යාපෘති යෝජනාව සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>

දැන් දූවිලි ඇල්ල ප්‍රධාන ආදායම් උත්පාදනය කරන ස්ථානයක් බවට පසුගිය වසරවල්වල පත් වෙලා තිබුණා. හැබැයි දැන් ගත්තොත් එහෙම මම පරීක්ෂණයකට පහුගිය සෙනසුරාදා ගියා. ඒ පරීක්ෂණයේදී තිබ්බ්ච දේ තමයි අපේ කඩ කාමර වෙන්දේසි දාලා ගත්තා කට්ටිය. ඒ අය අතර ආරවුලක් තිබුණා ගිවිසුම්ගත ඒවට එහා ගියපු දේවල් අලෙවි කරනවා කියලා. ඒක නිසා සමහර කඩවලට වෙළදාමක් නැහැ, ආදායමක් නැහැ කියලා. ඇත්තටම අපි ගිහිල්ලා පැහැදිලි කළා විශේෂයෙන් මමත් ගියා ඒකට. ඇත්ත කතන්දරේ එතන නෙවෙයි තිබුණේ දැන් සංචාරකයෝ එන්නේ නැහැ. ඒ සංචාරකයෝ එන්නේ නැති නිසා ඒ අයට වෙළදාමක් නැහැ, ආදායමක් නැහැ. ඒ නිසා අපේ දැන් ලොකු වගකීමක් තියෙනවා මේ සභාව විදියට අපි හැමෝගෙම. කොහොමද අපි මේක වැඩිදියුණු කරන්නේ, සංචාරකයින් ගෙන්වා ගන්නේ කියලා දේශිය සහ විදේශීයව. ඉතාම ආකර්ශනීය තැනක්. හැබැයි තවමත් අපිට පහළට ලයිට් නැහැ. 06 වෙනකොට කරුවලේ තියෙන්නේ. ඊට පස්සේ අලි ඇවිල්ලා අපේ ඩස්ට්බින් පොඩි කරලා තිබුණා. ඒක නිසා අපි සාකච්ඡා කරලා තාවකාලික විදුලි වැටක් ගහලා තියෙනවා. ඒ වගේම වනජීවී එකෙන් අපිට පොරොන්දු වෙලා තියෙනවා , ප්‍රදීප් මන්ත්‍රීතුමත් දන්නවා අපිට ඒ ටික ආවරණය කරලා විදුලි වැට ඉදි කරලා දෙනවා කියලා. ඒක නිසා අපිට පළවෙනි අදියරය විදියට අපි එතන නැරඹුම් මධ්‍යස්ථානයටත්, පහළ පඩිපෙළේ අත්වැට කැඩිලා තියෙනවා ඒක ප්‍රතිසංස්කරණ කටයුතු වලටත් අපිට යම් කිසි මුදලක් අපි ඉල්ලලා තියෙනවා. ඒ අනුව ඒ මුදල අපිට ලැබෙනවා කියලා තමයි දැනට තියෙන්නේ. එතකොට පළාත් පාලන අමාත්‍යාංශය මගින් අපිට රුපියල් මිලියන 05ක් ලබා දෙනවා. සභාව මගින් රුපියල් ලක්ෂ 05ක පමණ මුදලක් දරන්න වෙනවා. ඒ අනුව අපි මේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 05.5 ක පමණ දළ ඇස්තමේන්තුවකට සකස් කරලා තියෙනවා. එතකොට අපිට මේක ක්‍රියාත්මක කරන්න සභාවේ අනුමැතියක් ලබා ගන්න වෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

- ඒ අනුව පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධන මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම යටතේ, දූවිලිඇල්ල නැරඹුම් ස්ථානය සකස් කිරීම සහ සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සකස් කරන ලද ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-10 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන නාගරික සංවර්ධන සැලැස්ම (2024-2034) සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමියන් විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපිට මේ යෝජනාව සංශෝධනයක් සහිතව තමයි අනුමත කර ගන්න වෙන්නේ. අපිට මාස කිහිපයක් නාගරික සංවර්ධන අධිකාරියෙන් මේ යෝජනා කෙටුම්පත අපේ සභාවට දුන්නා. මං මීට කලිනුත් අවස්ථාවක සභාවක මේක දැනුවත් කළා. නාගරික සංවර්ධන අධිකාරියට විශේෂයෙන්ම ගත්තොත් අපේ විකිළිය ග්‍රාම සේවක වසමත්, කිරිමැටිතැන්න ග්‍රාම සේවක වසමත්, පවරගෙන තියෙනවා. ඒ අනුව මේකේ සංශෝධනය වෙන්න ඕනි දේ තමයි මේ යෝජනාවලියේ තියෙනවා කිරිමැටිතැන්න පොළ , ඇත්තටම කිරිමැටිතැන්න පොළ ගත්තට පස්සේ ඒක ඉතාමක් අපිළිවෙලක් සහිතව තමයි තියෙන්නේ. මහ පාරේ තියෙන්නේ. අපි සභාවක් ලෙස මේකට වග කියන්න ඕනි. මේ තරම් දියුණු ලෝකෙක , රටක , ඉතාමත්ම අපවිත්‍ර විදියට තමයි ඒ ආහාර වර්ග තියෙන්නේ. සමහරු බිම දානවා. මේ දවස්වල නම් වහින්නේ නැති නිසා හොඳයි, නැත්තම් වහින කාලෙට අර පාරේ තියෙන වතුරත් වදිනවා. ඒ වගේම වාහනවල දූම. ඊට අමරතව එතන පාර පටු වෙලා තියෙනවා. වාහන එක පැත්තක නවත්තලා තියෙනවා. එක පැත්තක තියෙනවා පොළ. ඒක නිසා අපිට මේක විධිමත් කරන්න ඕන. මේක විධිමත් කරන්න ඕන නිසාම නාගරික සංවර්ධන අධිකාරියත් එක්කත් අපි සාකච්ඡා කළා අපට තාමත් අයිතිය දුන්නේ නැතත් අපිට අයිතිය තියෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ තියෙන අපේ කඩේ තියෙන තැන මේ පොළ ඉදි කරන්න. එතන අපිට ඉඩ තියෙනවා අක්කර 03 වගේ ප්‍රමාණයක්. එකේදී පොළේ වෙළඳාම් කරන අය දැන ගත්ත ගමන්ම ඒ අය වැඩි පිරිසක් සභාවට ආවා මාව මුණ ගැහෙන්න. ඇවිල්ලා එගොල්ලෝ සම්පූර්ණ විරෝධය ප්‍රකාශ කළා ඒකට. ඒගොල්ලෝ කිව්ව දේ තමයි එතනට ගියොත් ඒගොල්ලන්ගේ වෙළඳාම නෑ. මේ පොළ ගත්තොත් ඇත්තටම වැලිගෙපොල සභාපතිතුමා මට හම්බ වුණා, එතුමා කිව්වෙත් වැලිගෙපොළ හන්දියේ තියෙන පොළට වඩා මේ පොළ දියුණුයි කියලා. වෙළදාම වැඩියි. මේක දවසෙම තියෙනවා. වැලිගෙපොල පොළ තියෙන්නේ පැය කීපයයි.

ඒක නිසා මේ පොළ අපිට අයින් කරන්න බැහැ. මේ පොළ වැඩි දියුණු කරන්න ඕනි. හැබැයි අතනට අරගෙන ගියාට පස්සේ වෙළෙන්දන මට කිව්ව දේ ගමයි ඒගොල්ලන්ගේ වෙළදාමත් නෑ, මිනිස්සු කිලෝ මීටර් 03ක් 04 ක් ඇවිදගෙන මෙතෙන්ට එන්නෙත් නැහැ බඩු ගන්න කියලා. ඒගොල්ලෝ මට කිව්වා බළන්ගොඩ පොළේ බඩු ගන්නේ නැතුව සමහරු එනවා කියලා මෙතනට බඩු ගන්න මෙතන හොඳ බඩු තියෙනවා කියලා. ඒක නිසා තමයි නාගරික සංවර්ධන අධිකාරිය අපිට කිව්වේ අපිට ඉඩමක් වෙන් කරලා දෙන්න, ඒගොල්ලෝ ඉදි කිරීම් කටයුතු සියල්ල කරන්නම් යූඩී එකේ සල්ලි තියෙනවා කියලා. අපි එහෙම හොයාගෙන යනකොට තමයි අපිට ඉඩමක් හම්බ වුණේ කිරිමැටිතැන්න හන්දියට ඉදන් වැලිගෙපොල පාරේ චුට්ටක් යනකොට පල්ලියට මෙහා පැත්තේ තියෙනවා LRC ඉඩමක්. අක්කර තුන්කාලක විතර බිමක්. මෙන්න මේ අක්කර තුන්කාලක විතර බිම ඒකට නඩුවක් තිබුණා, ඒ නඩුවෙදි නඩුව දාලා තිබුණු පාර්ශවය ඒ නඩුවෙන් ඉල්ලා අස් වෙනවා, LRC එක තමයි පාලනය කරන්නේ. ඒන නිසා ඒක තවමත් තියෙන්නේ LRC එකේ කියලා අපි හිතනවා. අන්න ඒ ඉඩම, ලොට් අංක 100 , ඒකේ නම පැල්මියන්හේන. මෙන්න මේ ඉඩම අපි කෘෂිකර්ම අමාත්‍යාංශයට ඒ කියන්නේ ගරු අමාත්‍යතුමාට දන්වලා තියෙනවා, අපිට ගරු ඇමතිතුමා මේ පිළිබඳව විධිමත් ලෙස සොයලා අපේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට මේක අරන් දෙනවා කියලා, කියලා තියෙනවා. අපට එහෙම වුණොත් ඇත්තටම ඉතාමත් ලස්සන , විධිමත් ලෙස මේ පොළ ඉදි කර ගන්න පුළුවන්. ඒකේ ගෞරවය මේ මුළු සභාවටම අයිති වෙනවා. ඒකේ ඉදි කිරීම් කරන්නේ UD එකෙන්. එතෙන්දි අපිට තවත් ආයතන ටිකක් තියෙනවා. කිරිමැටිතැන්න හන්දිය ගත්තොත් එතන ත්‍රිකෝණාකාර ඉඩම් කැබැල්ලක් තමයි තියෙන්නේ. එතන තමයි මොන්ටිසෝරියත්, පුස්තකාලයත්, ආයුර්වේදයත් තියෙන්නේ. අපිට සමහර ඒවා පුළුවන් වෙයි UD එකත් එක්ක කතා කරලා එතනට ගන්න. අපිට එහෙම වුණොත් සැහෙන්න ප්‍රශ්නෙකින් ගොඩ එන්න පුළුවන්. වර්තමානයේ තියෙන දේ තමයි මේ සියළු රාජ්‍ය ආයතන ඒකාබද්ධව තමයි වැඩ කරන්නේ. මීට කලියෙන් තිබ්බ්ව දේ තමයි රාජ්‍යයේ පොදු යහපත සඳහා රාජ්‍ය ආයතන වෙන් කළාට කාර්යක්ෂම වැඩ ටික කරගන්න, මෙතෙක් කාලයක් වෙලා තියෙන්නේ මේවා වෙන වෙනම තමයි ගිහිල්ලා තියෙන්නේ. දැන් වර්තමාන රජය උත්සාහ ගනිමින් තියෙනවා මේ රාජ්‍ය ආයතන සියල්ල ඒකාබද්ධ කරමින් රාජ්‍යයේ පොදු යහපත සඳහා වැඩ කරන්න. මම

අවස්ථා කිහිපයකදීම ගරු ආණ්ඩුකාරතුමියත් එක්කත් මේක කතා කළා. ගරු ආණ්ඩුකාරතුමිය මට කිව්වේ අනිවාර්යයයෙන් ඒක එහෙම කරන්න ඕනි , ඒකාබද්ධව අපි වැඩ කරන්න ඕනි කියලා. මේක තමයි යෝජනාව. යෝජනාව සංක්ෂිප්තව කිව්වොත් මම නාගරික සංවර්ධන අධිකාරියේ මේ කෙටුම්පත සම්මත කරන්න ඕනි අන්න අර සංශෝධනයත් එක්ක.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා</u>**

අපි කල්තොට. මේක වැලිගෙපොල පාර පැත්තට අරන් ගියාම පොඩි අසාධාරණයක් වෙනවා කල්තොට පැත්තට යන අයට. ඒක නිසා මම යෝජනාවක් කරනවා දැන් ඔය පුස්තකාලය ඇතුළුව ඒ රාජකාරී කටයුතු කරන තැන් ටික කිරිමැටිතැන්න හන්දියේ තියෙන, ඒ ඉදිකිරීම් ටික, ඒ සේවාව අපේ කඩේ අසළ ඉඩමට දාලා, එතන පොළ වැඩිදියුණු කරන්න පුළුවන් නම් මං හිතනවා වඩාත් හොඳයි කියලා. ඒක නිසා මං හිතනවා වෙළෙඳාමටත්, පොළ භූමියටත් ඒක බලපාන නිසා මම ඒක යෝජනා කරනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අපේ ගරු මන්ත්‍රීතුමාගේ අදහස ගත්තම අපිටත් ඒ හා සමානම අදහසක් තිබුණා. ඊට පස්සේ එතන තිබ්බ්ච් දේ තමයි එතන ළදරු පාසල තියෙනවා. එතකොට විශේෂයෙන්ම ඔය ළදරු පාසලට එතන අවට අය තමයි එන්නේ. ඉතින් ඒගොල්ලෝ ඉදිරිපත් කරන දේ තමයි එතන රාජ්‍ය සේවකයෝ ඉන්නවා, එතකොට රාජ්‍ය සේවකයෝ ඔෆිස් යන ගමන් තමන්ගේ දරුවා එක්කගෙන තමයි එන්නේ. එතකොට අතනට ගෙනිච්චොත් කිලෝ මීටර් ගාණක් ආපහු එන්න වෙනවා කියන එක තමයි එගොල්ලෝ කියන්නේ. එතෙන්දි ආයුර්වේදය ගත්තත් එහෙමයි. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා දන්නවා ආයුර්වේදවලට වඩාත්ම බෙහෙත් ගන්න එන රෝගීන් අවුරුදු 60 පැනපු අය. ඒගොල්ලොත් ඔය බස් එකෙන් බැහැලා ඔතනින් ඇවිල්ලා තමයි බෙහෙත් ගන්නේ. මං මේ කියන්නේ ඒ අය ඉදිරිපත් කරපු අපහසුතාවයන්. ඒ අනුව සළකලා බලලා තමයි මේ තීරණේ ගත්තේ. ඇත්ත යම් කිසි තීන්දුවක් ගන්නකොට යම් ගැටළුකාරී තත්ත්වයක් මතු වෙනවා. අපි යම් කිසි තීන්දුවක් ගන්නකොට ඒක ගන්නේ තරාදියක දෙපැත්ත දාලා වඩාත් වාසි පැත්ත නම් යටට බහින්නේ ඒ පැත්ත ගන්නවා. ඒ පැත්ත ගැනීමේදී අර්ථවත් වෙන්නේ නෑ 100%ක්ම නිවැරදියි කියලා. යම් ප්‍රමාණයක් තියෙනවා ගරු මන්ත්‍රීතුමා කිව්ව විදියට. හැබැයි ගරු මන්ත්‍රීතුමා එතන තියෙන්නේ වැඩි ඈතක නෙවෙයි. බොහොම කෙටි දුරක් තියෙන්නේ ඔතන. පයින් යන්න පුළුවන් ඉතාම කෙටි දුරක් තියෙන්නේ. අපි අර වැලිගෙපොල පාරේ කියල කිව්වම ටිකක් දුරයිනේ. අර අපේ රෙදි කඩයක් තියෙනවා එතන එහා පැත්තේ තියෙන්නේ පාරේ අයිනෙම. ඒක නිසා ඔබතුමාට චූටි ගැටලුවක් තියෙනවා. නමුත් දැනට තියෙන සුදුසුම තැන මෙතන කියලා තමයි අපේ නිළධාරිනුත් තීන්දු කළේ.

UD එකත් ඇවිල්ලා බැලුවා. ඒ අය වෙනමම ආවා මේක බලන්න. ඇවිල්ලා ඉවරවෙලා ඒගොල්ලෝ තීන්දු කළේ මැන්නා පාර කොච්චර දුර තියෙනවද කියල බලන්න. මං UD එකට පැහැදිලි කළා මේ යෝජනාව තියෙන්නේ අපි යෝජනා කරපු එකක් අපේ කඩේ ගාව. ඊට පස්සේ ඒගොල්ලෝ දුර මැනලා කිව්වා මෙතන කිසිම අපහසුතාවයක් නැහැ එතනින් බඩු අරන් ඇවිල්ලා ආපහු බස් එකට නගින්නත් පුළුවන් ඒ කියන්නේ ළගම පාර කියලා. නැත්තම් අපිට වෙන උත්තරයක් නැහැ. මොකද අපි බැලුවා ඔය කිට්ටුවෙන් පුද්ගලික ඉඩමක්වත් ගන්න. විශේෂයෙන්ම මම කතා කළා එතන තියෙන කර්මාන්තශාලාවෙනුත් , ඒ අය කිව්වේ දෙන්න පුළුවන් නම් දෙනවා නමුත් දැන් දෙන්න අපහසුයි කියලා. ඒක නිසා අර විදියේ ගැටලුවකුත් තියෙන්න පුළුවන්. නමුත් අපිට වෙන උත්තරයක් නැහැ මෙතනට මේ පොළ අරගෙන යන්නේ නැතිව. ඊට පස්සේ ළදරු පාසලයි, ආයුර්වේදයයි, තැපැල් කන්තෝරුව එතනින් අයින් කර ගත්තා ඒ නිසා පුස්තකාලය පොඩ්ඩක් ලොකු කර ගත්තා. ඒ කියන්නේ පුස්තකාලයට තිබුණේ පොඩි කාමරයක්. විශාල පොත් ප්‍රමාණයක් තියෙනවා , විශාල පාඨක සමාජෙකුත් ඉන්නවා, අපි ඒගොල්ලෝ පිළිබඳ ඇගයීමකුත් කළා මේ ළගදි. එතෙන්දි මමත් ඇත්තටම පුදුම වුණා. මම හිතුවේ ඇගයීම කරනකොට වැඩිපුරම එන්නේ තරුණ අය කියලා. ඇත්තටම ආවේ වයසක අය. නමුත් ඒගොල්ලෝ කියවනවා. අපිට ඕනි කම තියෙනවා කියවීමත්

වර්ධනය කර ගන්න. අපේ කිරිමැටිතැන්න ගත්තම, වේළිඔය ගත්තම , බුලත්ගම ගත්තම විශාල පොත් ප්‍රමාණයක් තියෙනවා. ඒ කියන්නේ වර්තමාන ආණ්ඩුවේ තේමා පාඨය තමයි පොහොසත් රටක් ලස්සන ජීවිතයක් කියන එක. ඒක ක්‍රියාත්මක කරන්න නම් අපි කියවන ප්‍රමාණය වැඩි කර ගන්න ඕනි. ඒ කියවීම තුළ ඇත්ත මිනිහෙක් නිර්මාණය වෙනවා. ආත්මාර්ථකාමීත්වය නැති , අනුන් ගැන හිතන , තමා ගැන දෙවනුව හිතන අත්ත මිනිහෙක් අපිට ඕනි ඒ පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ළගා කර ගන්න. ඒ අනුව අපි පුස්තකාලවලටත් වැඩි පහසුකම් දෙන්න ඕනි . අපි මේ සැරේත් විශාල පොත් ප්‍රමාණයක් ගෙනවා. අපි දැන් පාඨක සමාජත් හදලා මේක විධිමත් කරන්න. අන්න ඒ සඳහාත් ඔබතුමන්ලාගේ සහයෝගය අවශ්‍ය වෙනවා. මේ යෝජනාවට සම්බන්ධ නොවුණත් මගේ අදහස අපි හැමෝම මේ පුස්තකාලවල සාමාජිකයෙක් වෙමු. අපි හැම කෙනෙක්ගෙම අතේ පොතක් තියා ගමු.

- ඒ අනුව නාගරික සංවර්ධන සැලැස්ම තුළ ඇතුළත් මහජන පොළ සඳහා වන ව්‍යාපෘතිය දිගන මුකලාන ඉඩමේ ක්‍රියාත්මක කිරීම වෙනුවට ලොට් අංක 100 පැල්මියන්හේන නමැති **LRC** ඉඩම තුළ ක්‍රියාත්මක කිරීමේ සංශෝධනයට යටත්ව 2024-2034 නාගරික සංවර්ධන සැලැස්මට අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

- පෙ.ව.10.38ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය සභා රැස්වීම සඳහා පැමිණෙන ලදී.

### 06-11 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන පළාත් පාලන ආයතනවල කුඩා පාලම් වැඩිදියුණු කිරීමේ තිරසර ව්‍යාපෘතිය - 2026 යටතේ මැද්දෙකන්ද පනානාකන්ද ඇල්ලඋඩ පාර අසළ බෝක්කුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

මෙම යෝජනාවේ පොඩි සංශෝධනයක් වෙන්න ඕනි. අපි මේ යෝජනාව න්‍යාය පත්‍රයේ ඇතුළත් කරලා තියෙන්නේ එල්ලාවුද පාර අසල කියලා. ඒක වෙලා තියෙන්නේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් එවපු ලිපියේ ව්‍යාපෘතියේ නම සටහන් වෙලා තිබුණේ ඒ විදියට. ඒක නිසා ඒක නිවැරදි වෙන්න ඕනි ඇල්ල උඩ පාර අසල කියලා. එතකොට මේ යෝජනාව තියෙන්නේ පළාත් පාලන ආයතනවල කුඩා පාලම් වැඩිදියුණු කිරීමේ තිරසාර ව්‍යාපෘතිය - 2026 යටතේ පළාත් පාලන අමාත්‍යාංශය මගින් සිදු කළ ශක්‍යතා අධ්‍යයනයකින් පළාත් පාලන ආයතන කීපයකම ක්‍රියාත්මක කිරීම සඳහා කුඩා පාලම් ව්‍යාපෘති තෝර ගෙන තිබුණා. ඒකෙදි අපේ සභාවට අදාළව තෝර ගෙන තිබුණේ මේ මැද්දෙකන්ද පනානාකන්ද ඇල්ලඋඩ පාර අසල බෝක්කුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය. අපිට අමාත්‍යාංශයෙන් කියලා තිබුණා යෝජනා එවන්න කියලා. එතකොට අත්‍යාවශ්‍යම යෝජනාවක් විදියට තිබුණා මැද්දෙකන්ද මේ පාලම පිළිබඳ යෝජනාව. ඒ අනුව මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න අපිට මේ ගරු සභාවේ අනුමැතිය ලබා ගන්න අවශ්‍ය වෙන නිසා තමයි අපි මේ යෝජනාව සභාවට ඉදිරිපත් කළේ.

- ඒ අනුව මැද්දෙකන්ද පනානාකන්ද ඇල්ලඋඩ පාර අසල බෝක්කුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

<u>**හදිසි යෝජනා**</u>

**06-12 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන බළන්ගොඩ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ දෙවන අදියරය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
මෙම යෝජනාව හදිසි යෝජනාවක් විදියට ඉදිරිපත් කරන්න වුණ නිසා ඔබතුමන්ලාගේ සහ තුමියන්ලාගේ න්‍යාය පත්‍රවල ඇතුළත් වෙලා නැහැ. අපේ සභා ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියරය සඳහා රුපියල් මිලියන 30ක මුදලක් වැයවෙනවා. ඒකට අදාළ ඇස්තමේන්තු මේ වන විට සකස් කරලා තියෙන්නේ. ඒ අනුව අපි මේ මිලියන 30 සඳහා අතිරේක ප්‍රතිපාදන ඉල්ලලා ආණ්ඩුකාරතුමිය වෙත ලිපියක් මේ වන විට ඉදිරිපත් කරලා තියෙනවා. ඉතින් අපි හැමෝගේම අපේක්ෂාව තියෙන්නේ අපි මෙතනින් ඉවත් වෙන්න ඕනි. මේක රැස්වීම් ශාලාව. සමහර ව්‍යාපාරිකයින් , ඒ වගේම වැඩසටහන්කරුවන් අපෙන් ඉල්ලනවා රැස්වීම් ශාලාව යම් මුදලකට. නමුත් අපිට වෙලා තියෙන්නේ මේක දීගන්න බැරි ප්‍රශ්නයක් තියෙනවා. එකක් අපේ සභාව. අනික මේක සම්පූර්ණ වෙනස් කරලා තමයි අපිට දෙන්න වෙන්නේ. ඒක නිසා අපි ප්‍රමාද කරමින් ඉන්නවා සභාව තියෙන නිසා. ඒක නිසා මේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ තුමියන්ලාගේ වගේම අපි හැම කෙනාගෙම අභිප්‍රාය, අපි හැම කෙනෙක්ම ලබන සැරේ නැති වෙන්න පුළුවන්, අපි මේ පුටුවල හැමදාම ඉන්නේ නැහැ, පෞද්ගලික තනතුරු බලාපොරොත්තුවෙන් අපි මේ තැන්වලට එන්නේ නැහැ, අපෙන් යම් සේවාවක් අවශ්‍යනම් ඒ සේවාව කරලා අපි මෙතනින් බැහැලා යනවා. හැබැයි අපි ගියාට අපේ සභා රැස්වීමක් හොඳ තැනක තියන්න, පිළිවෙලට තියාගන්න තැනක් තියෙනවනම් අපි කවුරුත් ඒකට සතුටුයි. ඒක නිසා අපි ආපු දවසේ ඉඳලම අපි සියළු දෙනාගේම බලාපොරොත්තුව, අභිප්‍රාය, වෙන්නේ අපි ඉක්මනින්ම අපේ සභා ගොඩනැගිල්ල හදා ගන්න එක. ඒක නිසා අපි පළවෙනි අදියරය දැන් පටන් ගෙන තියෙනවා. ඒකේ වැඩ දැන් 85%ට වැඩිය අවසන් කරලා තියෙනවා. ඉතුරු ටික හදන්න අපිට මිලියන 30 ක් අවශ්‍ය වෙනවා. අපිට මිලියන 30න් සම්පූර්ණම වැඩ ටික ඉවර කර ගන්න පුළුවන්. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා මේ වර්ෂය තුළ ඒක සම්පූර්ණ කර ගන්න. ගරු ආණ්ඩුකාරතුමියත් එක්කත් සාකච්ඡා කරපු මොහොතේදී එතුමිය කිව්වෙත් මේක අනිවාර්යයයෙන් හදමු කියලා. ඒක නිසා අපි සභාව විදියට ගරු ආණ්ඩුකාරතුමිය වෙත යොමු කරන්න සහා අනුමැතිය ලබා ගන්න ඕනි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**</u>
මුලින්ම සභාපතිතුමාගේ උත්සාහය ගැන අපි සන්තෝශය ප්‍රකාශ කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමා, මං හිතන්නේ ගොඩාක් පළාත් පාලන ආයතනවල සභා ගර්භ හදලා ඉවරයි. මං හිතනවා අදහසක් විදියට ඔබතුමාට පුළුවන් නම් වෙනත් සභාවල්වල සභා ගර්භවල තියෙන ෆොමැට් එක බලලා අලුත් විදියට ඒක හැදුවොත් සුදුසුයි කියලා මම අදහස් කරනවා. ඒ වගේම ඔබතුමාගේ මහන්සියේ ප්‍රතිපල අපිට ඉක්මනින් ලැබෙයි . ඒක නිසා අපි සියළු දෙනාම ඒකමතිකව ඒ යෝජනාව ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
අපි අනිත් ඒවාත් බලලා ඒ විදියට හදමු නේද.

- ඒ අනුව බළන්ගොඩ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියරය සඳහා අනුමැතිය ලබා දීමටත්, ඒ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 30ක ඇස්තමේන්තුව සකස් කර, ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමටත් මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-13 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ඉඩමක් ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මේක අපේ දෙවෙනි හදිසි යෝජනාව. බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ කසළ කළමනාකරණ කටයුතු සඳහා සුදුසු ඉඩමක් ලබා ලබා ගැනීමට මේ දිනවල කටයුතු කරමින් ඉන්නවා. පළාත් පාලන කොමසාරිස්ගේ 2026-02-27 දිනැති ලිපිය අනුව සුදුසු ඉඩම් කොටසක් පිළිබඳව අපි ක්ෂේත්‍ර පරික්ෂණයක් කළා. ඒ ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අපේ ප්‍රදීප් මන්ත්‍රීතුමා විශාල මහන්සියක් ගත්තා , ඒ කියන්නේ මුල්ගම වසමෙන් මේ ඉඩමක් ලබා දෙන්න. අපි මතක් කරන්න ඕනි අපේ ග්‍රාම සේවක නිළධාරි, සැහෙන්න උනන්දුවක් දැක්වුවා අපිත් එක්කම ගියා මේ ඉඩම බලන්න. අපිට එතන අක්කර 02ට ආසන්න ප්‍රමාණයක් තියෙනවා. මේ සැරේ රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදීත් මේ පිළිබඳව සාකච්ඡාවට බඳුන් වුණා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සභාපතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන්ත පද්මකුමාර සහෝදරයාත් විශේෂ අවධානයක් යොමු කළා බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට මේ ඉඩම ලබා දෙන්න. ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරිනුත්, ඒ වගේම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕනි අපේ පළාත් පාලන කොමසාරිස්තුමාත්, සහකාර කොමසාරිස්තුමත්, විශාල වැඩ කොටසක් රාජකාරි තියෙද්දි මෙහාට පැමිණියා මේ ඉඩම ලබා දෙන්න. ඒ එක්කම දැන් අපිට තියෙනවා මේකට ආයතන කිහිපයකින් අවසර ගන්න. එකක් තමයි විදුලිබල මණ්ඩලයෙන් අපි අවසර ගන්න ඕනි, ඒ වගේම පරිසර අමාත්‍යාංශයෙන් අපි අවසර ගන්න ඕන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අපි අවසර ගන්න ඕනි, ඊට පස්සේ අපිට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසර ගන්න ඕනි, වන සංරක්ෂණ දෙපාර්මේන්තුවෙන් අපි අවසර ගත්තා වාචිකව ඒගොල්ලෝ ලිඛිතව දෙනවා කිව්වා.

එතනදි ලොකු පාරිසරික විනාශයක් වෙන්නේ නැහැ. ෆ්ලැට් පොළොවක් තියෙන්නේ, කලින් ඉදි කිරීම් කරපු තැනක්, ගොඩනැගිලි තිබුණු තැනක් කොන්ක්‍රීට් කරලා, සමහර ඒවා තාර දාලා තියෙන්නේ, අපිට හරි පහසුයි. මෙන්න මේ යෝජනාවට අපිට මෙන්න මේ ආයතනවලින් අනුමැතිය ගන්න ඕනි. අන්න ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය අවශ්‍ය වෙනවා.

ඒ එක්කම මං මේකට එකතු කරන්න ඕනි. අපි ඒ එක්කම කොමසාරිස්තුමා එක්ක සාකච්ඡා කරලා අපිට මේ කිට්ටුව තියෙනවා කලින් අපේ හිටපු ගරු සභාපතිතුමා මැදිහත්වෙලා කසළ බැහැර කරන්න තැනක් සූදානම් කරලා තිබුණා රජයේ ඉඩමක් මං හිතන්නේ, අපි ඒකත් බලන්න යමු කියලා. ඊට පස්සේ අපි ඒකත් බලන්න ගියා. අපි ඒක බලන්න ගියාට පස්සේ අපිට විරෝධයක් ආවා ඒ පැත්තටනම් කුණු දාන්න එපා කියලා. ඒ ප්‍රදේශයට කුණු ගේන්න එපා කියලා. අපි වැඩමුළුවක් තිබ්බා, මේ ගරු සභාවේ සියළුම මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා දැනුවත් වෙන්න ඕනි කාරණයක්, අලුත්ම තාක්ෂණයක් තියෙනවා කළු මැස්සා සම්බන්ධයෙන්. ඒක දැනට කරන්නේ රත්නපුර මහා නගර සභාව. රත්නපුර මහා නගර සභාවේ අපේ නගරාධිපති සහෝදරයා කඩුවෙල සහෝදරයාත් එක්ක මම වෙනම කතා කළා. කතා කරලා අපේ පරිසර කමිටුවේ නිළධාරින් සහ මන්ත්‍රීවරුන් සහ අපේ මන්ත්‍රීවරුන් නොවන අය , අපට පනතට අනුව සම්මත කර ගන්න පුළුවන්. ඒ අනුව අපි වෛද්‍ය තුෂාර මැතිතුමාත් ඒකට සම්බන්ධ කරගෙන තියෙනවා. එතුමා ලොකු උනන්දුවක් , ඕනිකමක් තියෙනවා මේක විධිමත් කරගන්න. එතුමත් සම්බන්ධ වුණා. එතනදි මෙහේ වැඩමුළුවක් තිබ්බා. අපි ඒ

වැඩමුළුව හැමෝටම කිව්වා. අපි ඒ ප්‍රදේශයේ ඉන්න පන්සලේ විහාරාධිපති අපේ ස්වාමීන් වහන්සේටත් ආරාධනා කළා. ඒකෙදි කිසිඳු හානියක් සිද්ධ වෙන්නේ නැහැ. ඒකේ දුගඳක් එන්නේ නැහැ. ඒ වගේම ලොකු ඉඩක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒක ඉතාම දියුණු ක්‍රමයක් කළු මැස්සාගේ ඒ ව්‍යාපෘතිය. ඒ කළු මැස්සා කීටයෝ දානවා. ඒ කීටයෝ තමයි දිරන කසළ කඩදාසි වගේ දේවල් නැතුව ආහාරයට ගන්න දේවල් සියල්ල ආහාරයට ගන්නවා. මොන තරම්ද කියනවනම් එක දවසට ටොන් 05ක් ආහාරයට ගන්නවා. ඒ කළු මැස්සාගේ ව්‍යාපෘතිය පටන් ගන්න දවසට ටොන් 05 ක් ඕනි. ඒක නිසා අපි කල්පනා කළා අපිට තනියෙන් මේ වැඩේ කරන්න බැහැ. ඒක නිසා අපි ආසනේ විදියට ඒකාබද්ධ වෙලා කරන්න ඕනි.

බළන්ගොඩ ආසනේට අයිති වෙනවා පළාත් පාලන ආයතන 03ක්. එකක් අපි, අනික බළන්ගොඩ නගර සභාව , අනික ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව. හැබැයි දැන් වර්තමානයේ හැදිලා තියෙන දේ තමයි අපි ඒකාබද්ධව තමයි වැඩ කරන්න ඕනි. ඒක නිසා අපි අර වැඩමුළුවට නගර සභාවේ ගරු සභාපතිතුමා සහ පරිසර කමිටුව, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ පරිසර කමිටුව සහ මන්ත්‍රීවරුන් සම්බන්ධ කර ගත්තා. අපිට දිරන කසළ එකතු වෙන්නේ ටොන් 3.5ක වගේ ප්‍රමාණයක්. අර වැඩේ කරන්න 05ක් ඕනි. එහෙනම් අපිට මේ වැඩේ තනියෙන් දැනට කරන්න බැහැ. ඒ වගේම මේකෙන් කාබනික පොහොරක් හැදෙනවා. ඒක ඉතාමත්ම ප්‍රබල එකක්. දැනට අපේ නගර සභාවේ කාබනික පොහොර හදනවා. ඒ කාබනික පොහොර අලෙවි වෙන්නේ නැහැලු. මොකද සමහර පොලිතින් සහ ප්ලාස්ටික් කැබලි ඒවට කලවම් වෙලා තියෙනවලු. මේක එහෙම නෙවෙයි. මේ කියන පණුවා ආහාරයට ගන්නේ තෝරලා. අපිට ඒ රත්නපුර මහා නගර සභාවෙන් ආපු මහජන සෞඛ්‍ය පරීක්ෂක අපේ ශ්‍රී ලාල් සහෝදරයා කිව්වා කොස් ගෙඩියක් දැම්මොත් ඇට විතරයි පණුවා තෝරන්නේ ඉතුරු ඔක්කොම ටික කනවා කියලා. උගේ වැඩේ කන එකම තමයි. කාලා පොහොරක් හදනවා. ඒක ඉතාමත්ම වටින පොහොරක්. ඒ කියන්නේ අධි නයිට්‍රජන් තියෙන එකක් ඒ. ඒ නිසා අපි ආහාර සුරක්ෂිතතාව ඇති කරන්න ඕනි, ආහාර සුලභ කරන්න ඕනි, කෘෂිකර්මාන්තය දියුණු කරන්න ඕනි, ඒකට මේ පොහොර ඉතාමත්ම වැදගත් වේවි. ඉහළ මිලකට දෙන්නත් පුළුවන්. ඒක නිසා මොකක්ද කළේ අපි නගර සභාවේ ගරු සභාපතිතුමා එක්කත් සාකච්ඡා කරලා අපි ඒකාබද්ධව කරමු. නගරසභාවේ දැනට බැංකියවත්තේ තමයි මේක තියෙන්නේ. ඒක නිසා ක්ෂේත්‍ර පරීක්ෂණයක් එවෙලෙම කළා. ඒකෙදි නගර සභාව අපිට දැනට ඒකාබද්ධව කර ගන්න පුළුවන්. ඊට පස්සේ අපිට ප්‍රශ්නයක් එනවා නොදිරන කසළ මොකද කරන්නේ කියලා. ඒකෙදි දැනට තියෙන තාක්ෂණය තමයි, බළන්ගොඩ නගර සභාව දැනට විශාල ප්‍රමාණයක් ගන්නවා, ඒගොල්ලන්ට වෙන් කරලා දෙන්න ඕනි. ඒක නිසා තාම ඒක තියෙන්නේ සාකච්ඡා මට්ටමේ.

ඒ කෙසේ වුණත් අපිට ඕනි මේ ටික ඔක්කොම කර ගන්න. ඒ කියන්නේ කොමසාරිස්තුමා අපිව දැනුවත් කළා මේ ඉඩම් අපි නිදහස් කරගමු කියලා සභාවට. අපිට අනාගතයේ , හෙට දවසේ මේවා ප්‍රයෝජනවත් වෙනවා. ඒ මුල්ගම ඉඩම කියලා කියන්නේ ඉතාම වැදගත් එකක්. ඒ කියන්නේ ඒ හරිය ජන ශූන්‍ය පැත්තක්. ඒ වගේම තැනිතලා පැත්තක්. පාරිසරික හානියක් සිද්ධ වෙන්නෙත් නෑ. ඒ නිසා මේ ඉඩම ඒ කියන්නේ බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති මුල්ගම ග්‍රාම නිළධාරි වසමේ රජවක රක්ෂිතයේ කැ.අ.62036 හි, කලාප අංක 01හි, කැබලි අංක 01.06 හි, හේක්ටයාර් 59 න් යුක්ත අහස් පොකුණ කියන ඉඩම අපි අත්පත් කරගමු. විශේෂයෙන්ම බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමියත් විශාල උනන්දුවක් දක්වනවා මේක අපිට අරන් දෙන්න. ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ගන්න අපිට ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඒ වගේම පරිසර අධිකාරියෙනුත් ප්‍රශ්නයක් නැහැ. ඒක නිසා ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සහ තුමියන්ලාගෙන් ඉල්ලා සිටිනවා මේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා.

- ඒ අනුව බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති මුල්ගම ග්‍රාම නිළධාරි වසමේ රජවක රක්ෂිතයේ කැ.අ.62036 හි, කලාප අංක 01හි, කැබලි අංක 01.06 හි, හේක්ටයාර් 59 න් යුක්ත අහස් පොකුණ නමැති ඉඩම බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ කසළ කළමනාකරණ

ව්‍යාපෘතියට යෙදවීම වෙනුවෙන් මෙම ඉඩම පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා සභා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**07. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

2026 පෙබරවාරි මස මුදල් කමිටු වාර්තා, ටෙන්ඩර් කමිටු වාර්තාව සහ පරිසර පොදු පහසුකම් කමිටු වාර්තාව ගරු සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කරනවා.

7.1 මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තා - 2026-02-10 / 2026-02-26

- සභාව විසින් සළකා බලන ලදී.

7.2 ටෙන්ඩර් කමිටු වාර්තාව - 2026-02-02

- සභාව විසින් සළකා බලන ලදී.

7.3 පරිසර හා පොදු පහසුකම් කමිටු වාර්තාව - 2026-01-27

- සභාව විසින් සළකා බලන ලදී.

**08. ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

2026 පෙබරවාරි මාසයට අදාළ ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශය සහ එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව වෙත සළකා බැලීම සඳහා ඉදිරිපත් කරනවා.

- සභාව විසින් සළකා බලන ලදී.

**09.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි, ලේකම්තුමියගෙන් අවසරයි, ඒ වගේම සහෝදර මන්ත්‍රීතුමන්ලාගෙන්ද අවසරයි, මාධ්‍යවේදී මහත්වරුන්ගෙන් අවසරයි. බළන්ගොඩ මැතිවරණ කොට්ඨාශයේ කෘෂි අංශයේ, ලෝකවාසී ජනතාව, මහා හින්දු බැතිමතුන් මහා ශිව රාත්‍රි උත්සවය සමරන අවස්ථාවේ බළන්ගොඩ මැතිවරණ කොට්ඨාශයේ පළමුවරට එම රාජ්‍ය උත්සවය පවත්වලා ඉතාම සාර්ථක ලෙස නිරත වුණා. එම නිසා අපේ ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණේ නායක පාර්ලිමේන්ත්‍ර මන්ත්‍රී මනෝගනේෂන් මැතිතුමා , කඳුරට ජනතා පෙරමුණේ නායක ආචාර්ය වී.රාධක්‍රිෂණන් මැතිතුමා, කම්කරු සංගමයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී පී.දිගම්බරම් මැතිතුමා සභාවේදී මේ උත්සවය වෙනුවෙන් මට ස්තුති කරන්න කියලා ප්‍රකාශ කළා . ඒ නිසා මම අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමන්ටත්, ගරු අග්‍රාමත්‍යතුමිය හරිනි අමරසූරිය මැතිනියටත්, ගරු සංස්කෘතික අමාත්‍ය හිනිදුම සුනිලි සෙනෙවි මැතිතුමන්ටත්, රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වතු යටිතල පහසුකම් නියෝජ්‍ය ඇමති සුන්දරලිංගම් ප්‍රදීප් මැතිතුමාටත්, රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාටත්, ජාතික ජන බලවේගයේ බළන්ගොඩ මැතිවරණ කොට්ඨාශයේ ආසන සංවිධායක හිටපු පළාත් සභා මන්ත්‍රී අපගේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමාටත්, අපගේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙනුත් , මා වෙනුවෙනුත් , ඒ වගේම සිරි මුත්තුඅම්මාන් පරිපාලක සභාව වෙනුවෙනුත්, අපගේ විශේෂ ස්තුතිය පුද කරනවා. ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, දැනට අපේ රජයේ ප්‍රධාන ව්‍යාපෘතියක් විදියට ක්‍රියාත්මක වෙනවා විෂ ණය විදියට අපි සළකන්නේ මහජන ආරක්ෂක කමිටු. ඒ පිළිබඳව සමහර වසම්වල යම් යම් මත්ද්‍රව්‍ය තුරන් කිරීමේ ව්‍යාපාරය. ඒ යටතේ ගම්වල ක්‍රියාත්මක වෙන පහළම යාන්ත්‍ර ගැටලු මතුවුණා. පෞද්ගලිකව මම සම්බන්ධ වෙන දෙහිගස්තලාව වසමෙත්, කිරිදිගල වසමෙත් ක්‍රියාකාරිත්වය පිළිබඳ යම් යම් සහභාගි වන්නන් නෙවෙයි, මෙහෙයවන්නන් අතරේ පොඩි පොඩි ගැටලුකාරී තත්ත්වයක් තියෙනවා. ඒ නිසා මම හිතනවා අපේ සභාව හරහා සහ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිතුමා හරහා ප්‍රාදේශීය ලේකම්තුමාට සහ සහකාර පොලිස් අධිකාරිතුමාව දැනුවත් කිරීමක් කරන්න. මොකද මේ ක්‍රියාකාරිත්වයේ යම් යම් ගැටලුකාරී තත්ත්ව තියෙනවා මොකද එයාලා රාජකාරි ජීවිතයේ බොහොම කාර්යබහුලයි මේ ග්‍රාම නිළධාරි සහ පොලිස් නිළධාරින්. ඒ අයට මේ සඳහා යම්කිසි උපදෙස් ටිකක් තියෙනවා ක්‍රියාකාරිත්වය තව දුරටත් වැඩි කර ගන්න . අපේ සහභාගිත්වය තියෙනවා, සාමාජිකයන්ගේ සහභාගිත්වය තියෙනවා හොඳින් තියෙන්නේ අර ගැටලුව. අනිත් එක තමයි ගියවර අපේ ඉක්බාර් මන්ත්‍රීතුමා කතා කළා අර මුදල් එකතු කිරීම සම්බන්ධව. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා බළන්ගොඩ සමූපාකාර මන්දිරයේ පවත්වන්න සැලසුම්කරලා තිබුණු උත්සවය පොලිස්පතිතුමාගේ නියෝගයකින් අවලංගු කරලා ඒ කටයුත්ත නතර කරලා තියෙනවා. මොකද මුදල් එකතු කිරීමේ ගැටලුවක් තියෙනවා. මොකද මුදල් එකතු කරන්න අවසරයක් අපේ තිබුණේ නෑ. ඒගොල්ලෝ දැනුම්දීමක් කළා රු.500/=කුත් අරගෙන එන්න කියලා. අපි ඒ වෙනකොට හැඳුනුම්පත් සඳහා ඡායාරූප සහ අයදුම්පත් භාර දීලා තිබුණේ. නැවත වරක් ෆොටෝ ගන්න සහ හැඳුනුම්පත සකස් කරන්න මුදල් අය කිරීම මේ වෙනකොට නතර වෙලා තියෙන්නේ. ඔබතුමා මතක් කළා, ඒක දැන් එලදරලා සිද්ධ වෙලා තියෙන්නේ. එතනදි ක්‍රියාකාරිත්වය සතුටු දායකයි. මොකද සාමාජිකයන් පැමිණෙනවා නමුත් ඉහළ ක්‍රියාකාරිත්වය , ඉහළ නිළධාරින්ගේ යම් ගැටලුවක් තියෙනවා. මං හිතනවා අපේ සභාව හරහා හෝ සම්බන්ධීකරණ කමිටුව හරහා හෝ වසන්ත පුෂ්පකුමාර මහතා හෝ මේ දැනුවත් කිරීම කර අපිට ඒක නැවත ක්‍රියාකාරී වෙන්න පුළුවන් කියන එක මගේ අදහස. එතනදි මං මතක් කරනවා අපේ ජනාධිපතිතුමා පෙබරවාරි 04 වෙනිදා ජාතික නිදහස් දිනයේදී මතක් කළා ඉක්මන් ගමනක් යන්න ඕනි නම් තනිව යන්න, එක්ව ගමනක් ගියොත් වැඩි දුරක් යන්න පුළුවන් කියලා. ඉතින් අපි සියළු පාර්ශවයන් එකතු වෙලා යන ගමනකින් වැඩි දුරක් යන්න පුළුවන්. අපි ඒ සඳහා තමයි සූදානම් වෙලා තියෙන්නේ. ජනාධිපතිතුමාගේත් ඒ අදහස තියෙනවා.

ඒත් එක්කම තවත් කාරණයක් මතක් කරන්න ඕනි සභාපතිතුමනි, ජනවාරි මාසේ සම්බන්ධීකරණ රැස්වීමේදී මතක් කළා , ඉල්ලීමක් කළා නිරාශා මන්ත්‍රීතුමියගේ යෝජනාවක් විදියට තොටුපලතැන්න බස්එක නැවත ක්‍රියාත්මක කරන්න කියලා. ඒ බස් එක කලින් තිබුණා. තොටුපලතැන්න දක්වා බළන්ගොඩ නගරයේ සිට කුඩා බස් රථයක් ධාවනය වුණා. දැන් ඒ පාර සකස් වෙලා තියෙනවා තවත් කිලෝ මීටරයක් විතර ඉදිරියට. කාපට් කරලා තියෙනවා. ඒ පාරේ තව දුරටත් ඉදිරියට යන්න පුළුවන්. ඉතින් ඒ බස් සේවය ආරම්භ කරන්න ඩිපෝව කැමැත්ත පළ කළා. ඒගොල්ලන්ගේ ශක්‍යතා අධ්‍යයනයක් කරලා අපිට දැනුම් දීමක් කරනවා කිව්වා. ඒ මාසයක කාලය ඉවර වෙලා තියෙනවා. තාමත් තාම ඒක ක්‍රියාත්මක වෙලා නෑ. අපි සභාව හරහා හෝ සම්බන්ධීකරණ සභාපතිතුමා හරහා මතක් කරනවා ඒ මාර්ගයේ බස් රථය ධාවනය කරන්න බැරිනම් එතනදි තීන්දු කළේ මාර්ග සංවර්ධන අධිකාරිය හරහා පෞද්ගිලක බස් රථයකට අවස්ථාව දෙනවා කියලා. අන් ඒ කාරණා 02 සම්බන්ධයෙන් අවධානය යොමු කරලා ඒ බස් රථය ලබා ගත්තොත් ඒ ජනතාවට විශාල සේවයක් වෙනවා. ඒ ජනතාවගේ ජීවිත ලස්සන කරන්න අපිට අවස්ථාව ලැබෙනවා. ඒක මතක් කරමින් මගේ කතාව අවසන් කරනවා. සියළු දෙනාටම ස්තුතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**

ගරු සභාපතිතුමා,සෑම වසරකම මාර්තු 08 වෙනිදා ලොවපුරා ජනතාව විසින් කාන්තා දිනය සමරනවා. එතුමියන්ලා විශේෂ කාර්යයභාරයක් කරනවා අපේ සමාජය එතුමියන්ලාගේ උර මතින් හොඳ තැනක

තියන්න. ඒ වගේම මෙතුමියන්ලා මහන්සිවෙලා අරගල කරලා ලබා ගත්ත ජයග්‍රහණත් තියෙනවා ලෝකේ. ඉතින් මම පහුගිය 08 වෙනිදා පැවති එම කාන්තා දිනය සැමරීම වෙනුවෙන් අපේ සභිකවරියන්ට සහ අපේ ගරු ලේකම්තුමියටත්, කාර්ය මණ්ඩලයටත්, අපේ ගරු පක්ෂ නායකතුමාගේ සුභාශිංසන සහ අපේ කණ්ඩායමේ සුභාශිංසන අපි එක් කරනවා.

ඊළග කාරණය තමයි ගරු සභාපතිතුමා බළන්ගොඩ රාස්සගල ඌවැල්ල මාර්ගයේ කිලෝ මීටර් 05 කණුවේ සිට 10 කණුව දක්වා කොටස දෙසැම්බර් මාසේ මුල්ගල තියලා රුපියල් මිලියන 500ට වැඩි මුදල් ප්‍රතිපාන වෙන් කරලා එම මාර්ගය මංතීරු 02ට කාපට් කරලා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළා. කැන්වෙල් කියන ඉංජිනේරු ආයතන මගින් සහ ආර්.ඩී.ඒ.අධීක්ෂණය යටතේ මේ දවස්වලඉතා හොඳින් ඒ වැඩකටයුතු කෙරීගෙන යනවා. මං හිතන්නේ මාස 20 කින් මේ ව්‍යාපෘතිය අවසන් කරන්න තියෙන්නේ. අපේ ගුණරත්න මන්ත්‍රීතුමත් දන්නවා පොඩි ගැටලුවත් තියෙනවා සභාපතිතුමා 9 කණුව ඒ කියන්නේ රාස්සගල කුඩා නගරය ආරම්භ වන තැන. එතන ඉඳලා කිලෝ මීටර් 10 කණුව දක්වා තමයි රාස්සගල කුඩා නගරය එහෙම නැත්තම් රාස්සගල කඩ වීදිය කියලා සළකන්නේ. ඉතින් එතකොට මේක සත්‍යද අසත්‍යද කියලා දන්නේ නැහැ, ඔබතුමා හොයලා බලන්න, අපිට තොරතුරක් ලැබිලා තියෙනවා දැන් තියෙන කාපට් එක උඩින්ම කාපට් එක ගහනවා කියලා. ඒ කියන්නේ අපි ආර්.ඩී.ඒ. නිළධාරින් එක්ක කතා කළා. එතකොට කිව්වේ සෙන්ට්‍රල් ලයින් එකේ ඉඳලා, ඒ කියන්නේ මධ්‍ය රේඛාවේ ඉඳලා ඒ පැත්තට 15 යි මේ පැත්තට 15 යි අඩියක පමණ කාණුවක් ඉදිකරනවා කියලා. නමුත් එහෙම කළොත් එහෙම දැනට සාමාන්‍යයෙන් තියෙන්නේ අඩි 18ක් 20 ක් විතර. එහෙම වුණොත් විශාල සල්ලි ප්‍රමාණයක් අපතේ යනවා. ඒ වගේම එතන අවශ්‍ය සංවර්ධනය වෙන්නේ නැහැ. මොකද බළන්ගොඩ ඉඳලා අපි කොළඹ මාර්ගය භාවිතා කරනකොට යම් කිසි හේතුවක් නිසා රත්නපුර දක්වා අපහසුතාවයට පත් වුණොත් අපි දන්නවා බයි රෝඩ් එකක් විදියට ඒ කියන්නේ අතුරු මාර්ගයක් විදියට පාවිච්චි කරන්නේ ඔය රාස්සගල හරහා වේවැල්වත්ත හරහා රත්නපුර මාර්ගය. එම නිසා කිලෝ මීටර් 04ක් නියමිත ප්‍රමාණයට ඉදි කරලා තව කිලෝ මීටරයක් ඒ තියෙන ප්‍රමාණයට කළොත් ඒක ලොකු ප්‍රශ්නයක්. ඔබතුමා ඒක තේරුම් ගනියි කියලා මම විශ්වාස කරනවා. ඒ ගැන ඔබතුමා අවධානය යොමු කරලා හැකි ඉක්මනින් අවශ්‍ය පිළිතුර අපට ලබා දෙයි කියලා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමා මම ගොඩක් ළඟ ම තමා මම ව්‍යාපාර කටයුතු කරන කොට නගරේ ඉන්නේ. මම දැක් කාරණයක් තියෙනවා. මොකද බළන්ගොඩ තියෙන ඖෂධ අලෙවිසල් සීමිතයි. හවසට විශාල තදබදයක් තියෙනවා. ගොඩක් ඔය වෛරස් රෝගයක් එහෙම ආවම එන්න ඕනි බෙහෙත් ගන්න. වෛද්‍යවරුන් ඔවුන්ට ෆාමසිවලින් බෙහෙත් ගන්න නියම කරනවා. එතකොට කුඩා ළමුන් තියාගෙන ගොඩක් වෙලා ඉන්න වෙනවා ලොකු අපහසුතාවකට පත් වෙනවා. ඒ වගේම නියමිත ප්‍රමිතියේ ඖෂධ තියෙනවද කියලා පොඩි ගැටලුවකුත් තියෙනවා. එම නියමිත ප්‍රමාණයේ ඖෂධ මිලදී ගැනීමටත්, විවිධ වෙළෙඳුන්ගේ වෙළඳ මාෆියාවන් නැති කිරීමටත්, ගුණාත්මක ඖෂධ වෙළඳපොළට ලබා ගැනීමටත්, රජය මගින් පාලනය වන රාජ්‍ය ඔසුසළක් බළන්ගොඩ ප්‍රදේශයේ ඉදිකරන්න පුළුවන් නම් ඒක ඉතාමත් හොඳයි කියලා මම විශ්වාස කරනවා. ඔබතුමා සම්බන්ධ වෙන එම රැස්වීමකදී සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ඔබතුමාට පුළුවන් නම් ඒ කාර්යයභාරය ඉෂ්ඨ කරන්න උත්සාහ කරන්න. ඒ කරුණු ටික තමයි මට විශේෂයෙන් මතක් කරන්න තියෙන්නේ.

ඒ වගේම ගරු සභාපතිතුමා ගියවර සම්බන්ධීකරණෙදි , සම්බන්ධීකරණය අපි දැන ගත්තේ අන්තිම දවසේ ඒවා මෙතුමියන්ලාගේ වැරදි නෙවෙයි මෙතුමාට තමයි ඒකට සම්බන්ධ වෙන්න අවස්තාව දීලා තිබ්බේ. එතුමා දන්නෙත් නෑ, මම දන්නෙත් නෑ. නමුත් ඡන්ද දායකයෝ 93000ට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙනවා . වසම් 53ක නියෝජනයක් තමයි අපි සියළු දෙනාම. එතකොට අපේ මන්ත්‍රීලාගෙන් කිසිම කෙනෙක් අපේ කණ්ඩායමේ හෝ ඔබතුමන්ලාගේ කණ්ඩායමේ නැත්තම් එක් හරි ප්‍රශ්නයක් සභාපතිතුමනි. මොකද අපි දේශපාලන අධිකාරිය. අපි තමයි දේශපාලන අධිකාරියේ තීන්දු තීරණ ගන්නේ. රජයේ ආයතන කියන්නේ ඒවා ක්‍රියාත්මක කරන ඉන්න පරිපාලනයක්. පරිපාලන ආයතන

දේශපාලන අධිකාරියට වඩා ඉහළින් යනවනම් ඒක ලොකු ගැටලුවක්. මොකද මම මේක මෙතනින් නවත්තන්නේ නෑ. මීට පස්සේ මේ ප්‍රශ්න වුණොත් දේශපාලන අධිකාරියේ ඉහළටම දන්වන්න මම ඒ අවශ්‍ය කටයුතු ලැස්ති කරනවා. මොකද අපි දන්නවා 2018 පළාත් පාලන මැතිවරණය තියන්න කලින් ඒ අවුරුදු ගාණක් තිබ්බා. එතකොට මේ පළාත් පාලන ආයතන පාලනය වුණා කොමසාරිස් පාලනය යටතේ. නමුත් මහජනතාවට රාජ්‍ය සේවයක් වුණේ නැහැ. අපි හිතමු කොහේ හරි ඉවුරක් කඩා වැටුණොත් ගමේ මන්ත්‍රීට කිව්වොත් එතුමා අනිවාර්යයයෙන් ඔබතුමාට කතා කරලා, නගර සභාවට කතා කරලා ඒ කරන්න ඕන දේ කරනවා. මොකද එතුමා ඒ ගමේ ඉන්න ඕනි. නමුත් අපි දන්නවා රාජ්‍ය සේවකයෝ අපහසුතාවට පත් කරන්නේ නෑ, එතුමන්ලා කල් මරනවා. ඒ නිසා තමයි දේශපාලන අධිකාරිය පළාත් පාලන ආයතන ඇතුළට සම්බන්ධ කරලා තියෙන්නේ. එතකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ නිළධාරින්ට ඕන විදියට මේක හසුරුවන්න උත්සාහ කරනවනම් ඒක ඔබතුමා කල්පනා කරන්න. මොකද ඔබතුමාට මතක ඇති ආදාහනාගාරේ ගැන සාකච්ඡාවක් ආවා, ලේකම් මිස් සම්බන්ධ වෙලා හිටියා, එතකොට ඔබතුමා සභාපති වෙලා 02පාරයි හෝ තුන්පාරයි. එතකොට මම තමයි අදහස් දැක්වුවේ. නැත්තම් අපි අපහසුතාවට පත් වෙනවා. ඉතින් ඒ වගේ තියෙනවා. ඔබතුමා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දන්වන්න තියන්න දවස් 02/03ට කලින් නෙවෙයි අවශ්‍ය කාලයට ඒවා දන්නලා අපිව සම්බන්ධ කරන්න කියලා. ඒ වගේම තමයි පළාත් පාලන විවාද තරගයක් ගැන දාලා තිබ්බා ගෘෘප් එකේ. අවසාන දිනේ තිබ්බේ 10. ඒකට පොඩ්ඩක් සාකච්ඡා කරලා අවශ්‍ය කටයුතු කරන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.වී.නිලානි දීපශිකා පෙරේරා මැතිනිය**</u>

ගරු සභාපතිතුමනි, ලේකම්තුමියගෙන් අවසරයි, පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි, මුලින්ම මම නැගී සිටියේ පෞද්ගලික අදහස් දැක්වීමට. ඒ කියන්නේ අපි ගැන කතා කරන්න. දැන් දවස් 02ට විතර කලින් මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ මාර්තු 08 වෙනිදා අපේ කාන්තා දිය යෙදී තිබුණා. ලෝක කාන්තා දිනය. ඉතින් මං හිතනවා මේ සැරේ වසර ගණනාවකට පස්සේ පුදුම විදියට කාන්තාවෝ එකතු වෙලා මේ කාන්තා දිනය සැමරුවා. ඒක සියළුම දෙනා දකින්නත් ඇති, දන්නවත් ඇති, ඒ විදියට කාන්තාවෝ ඉස්සරහට ඇවිල්ලා කාන්තා දිනය සමරන්න ලොකු විශ්වාසයක් ඇති වෙලා තියෙනවා සමාජයේ මේ වර්තමාන ආණ්ඩුව ගැන. ඉතින් මං ඒ ගැන සන්තෝශ වෙනවා, නිහතමානී ආඩම්හරයක් තියෙනවා. අපි කාන්තාවෝ විදියට මං හිතන්නේ මේ සභාවෙත් කාන්තා නියෝජන 08ක් තියෙනවා පක්ෂ විපක්ෂ, ඉතිං මං හිතනවා ඉදිරි කාලයේදී මේ මට්ටම 30%ක් තමයි තියෙන්නේ. අපි බලාපොරොත්තු වෙනවා ඒ මට්ටම 50%ක් කරගන්න. ඒ වගේම තමයි ඔබතුමන්ලා දන්නවා ඇති ලංකාවේ 52%ක් අපි ඉන්නේ කාන්තාවෝ. ඉතිං මේ 52 මේ වෙන කොට සක්‍රිය වෙලා තියෙනවා හැම තැනම, හැම ආයතනයකම ක්‍රියාකාරීව වැඩ කරනවා, රටට සේවයක් කරනවා, අග්‍රාමාත්‍යතුමිය අපේ කාන්තාවක්, උදාහරණයක් විදියට ගත්තොත් මේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියත් කාන්තාවක්, මෙතන 90%ක්ම මං හිතන විදියට ඉන්නේ කාන්තාවෝ. ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්තුමිය කාන්තාවක්, ඉතිං ඒ හින්දා අපිට ආඩම්හරයක් තියෙනවා අපි දැන් ඉස්සරටත් වැඩිය කාන්තාවෝ කුස්සියට සීමා වෙලා හිටියා, ඒ වගේම එක රාමුවකට කොටු වෙලා හිටියා, දැන් ඒ අය ඉස්සරහට ඇවිල්ලා තියෙනවා. මං හිත්නනේ දේශපාලන පිටියත් දැන් කාන්තාවෝ ගොඩ දෙනෙක් එකතු වෙලා තියෙනවා. ඒ කියන්නේ මේ ආණ්ඩුවත් එක්කත් ලොකු විශ්වාසෙකින් ඉන්නවා. ඉතං මං හිතනවා කාන්තාවන්ට ඉස්සරහට ලොකු වැඩ කොටසක් තියෙයි කියලා කරන්න. ඉතිං අපි හැම දෙනාම එකතු වෙලා පක්ෂ විපක්ෂ නැතිව අපේ සමාජයේ හැම කාන්තාවකටම පොදුවේ බෙදිලා යන විදියට අපෙන් වෙන්න ඕනි යුතුකම දේශපාලන අධිකාරියක් විදියට අපේ වසම් වල ඉන්න සියළුම කාන්තාවන්ට සම සේ බෙදී යන විදියට එයාලට අපේ ප්‍රතිපාන වෙන් කරලා දීලා එයාලට සහයෝගය දක්වන්න ඕනි එයාලගේ අනාගතේ ශක්තිමත් කරන්න. සියළු දෙනාම ඒකට කැප වෙමු කියලා යෝජනා කරනවා, ඒ වගේම මං හිතනවා සියළුම කාන්තාවන්ට ජීවිත පිළිබඳ තීන්දු තීරණ ගැනීමේ අයිතිය සැම ගැහැණියකටම තිබිය යුතුයි. මං හිතනවා ඉදිරියේදී ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනවා , ඒ සඳහා කටයුතු කරමින් පවතිනවා. ඒක නිසා මං හිතනවා කාන්තාවක් විදියට අපට ඉස්සරහට බය නැතිය නොබියව මේ කාන්තා ශක්තීන්

ඉස්සරහට ගෙන යන්න පුළුවන්. සමාජයේ කතා බහක් තියෙනවා අම්මා සතුටින් නම් මුළු පවුලම සතුටින් කියලා. ඉතින් අපි සියළුම දෙනා අම්මව සතුටින් තියලා එයාව සවිබල ගන්වන්න ඕනි. ඒකට අපි එකතු වෙලා, අපි මන්ත්‍රීතුමියන්ලා විදියට කතාබහ කරලා අපේ වසම්වල තියෙන සියළුම කාන්තාවන්ගේ ප්‍රශ්නවලට මැදිහත් වෙමු. ඒ නිසා එක එක්කෙනාගේ බල තණ්හාවලට තමුන්ගේ බලය ඉස්සරහට ගෙනියන්න කාන්තාවන් විදියට අපි කටයුතු නොකර අපේ කාන්තාවන්ගේ සියළුම ප්‍රශ්නවලට ඉතා ඉක්මනින් මැදිහත් වෙලා කාන්තාවන් ඉස්සරහට ගෙනියන්න මැදිහත් වෙමු කියලා ආයාචනාත්මකව අපි සියළුම මන්ත්‍රීවරියන්ගේ ඉල්ලා සිටිනවා. ඒ වගේම සියළුම කාන්තාවන්ට ජය වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**

ගරු සභාපතිතුමා, මලිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ ගිය පාර සම්බන්ධීකරණ කමිටුවට ඔබතුමා නම් නස් කරලා තිබුණනේ රැස්වීමට යන්න කියලා. මට සම්බන්ධීකරණ රැස්වීම දවසේ මේගොල්ලෝ කතා කරලා අහනවා රැස්වීමට යන්නැද්ද කියලා ඔබතුමාට කතා කරලා කිව්වේ නැද්ද කියලා. ඊට පස්සේ මේගොල්ලෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කතා කරලා තියෙනවා මන්ත්‍රීතුමාට ඕගොල්ලෝ කතා කරලා නැතේ ඇයි ඒ කියලා අහලා තියනවා. ඊට පස්සේ ඒගොල්ලෝ මට කතා කරලා අහනවා මන්ත්‍රීතුමා රැස්වීම තියෙනවා දැන් එන්න පුළුවන්ද කියලා. ඉතින් ඒ වෙලාවේ මම හිටියේ ඇඹිලිපිටියේ. දැන් නමේ හමාරයි, තාම පටන් ගත්තේ නෑ ඔබතුමා එන්න කියලා කිව්වා. ඉතින් මට ඇඹිලිපිටියේ ඉඳන් ඔතනට එන්න 10.30වත් වෙයි. ඒක නිසා මම කිව්වා මට එන්න විදියක් නෑ කියලා. එතකොට අශොක් මන්ත්‍රීතුමා යන්න හිටියේ එතුමා ගියෙත් නෑ මල්ලිගේ දානේ කියලා. එතකොට මලිත් මන්ත්‍රීතුමාට කිව්වෙත් නැනේ. ඒ නිසා එයා ගියෙත් නෑ, මම ගියෙත් නෑ, කොහොම හරි කවුරුත් නෑ. තව එකක් තියෙනවා සනත් මන්ත්‍රීතුමා කිව්ව විදියට හැඳුනුම්පත් සකස් කිරීමේදී මුදල් ප්‍රශ්නයක් ආවා. අර සමූපකාර මන්දිරයේ අපි 208ක් හිටියා එදා . නමුත් පොලිස්පති තුමාගේ නියෝගය මත ඒක නවත්තලා තිබුණා. ඉතින් ඒක ප්‍රශ්නයක් නැනේ.ඉතින් මම ඒකට ස්තුතිවන්ත වෙන්න ඕනි . අපේ මාධ්‍යවේදී මහත්වරුන්ටත් ස්තුතිවන්ත වෙන්න ඕනි. නැවත අර එකතු කරපු රු.500/= ආපහු ලබා දෙන්න කටයුතු කළා කියලා කියනවා. කොහොමද දන්නේ නැහැ. ඒක පොඩ්ඩක් හොයලා බලන්න.

ඒ වගේම සභාපතිතුමා එදා විශේෂ සභාවේදී 2025 අවසාන ගිණුම් වාර්තාවට අනුමැතිය ගන්න ඉදිරිපත් කළා. එතනදි ඔබතුමා කිව්වා හැමෝම ගෙන්නලා මේ සභාවට කලින් විශේෂ රැස්වීමක් තියලා ඒ ගැන අවබෝධයක් දෙනවා කියලා. ඒ වුණාට ඒක වුණේ නෑ. ඉතින් ඒකත් පොඩ්ඩක් අවබෝධ කරලා දෙන්න අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා</u>**

ගරු සභාපතිතුමා මම ලබන මාසේ තමයි කතා කරන්න බලාපොරොත්තු වෙලා හිටියේ. නමුත් මගේ පෞද්ගලික අදහසක් විදියට මෙතෙක් කතා කරපු ඒ මාතෘකාවලින් බැහැරව යමක් කියන්න තමයි මම හිතාගෙන ඉන්නේ. හැබැයි වරදවා වටහා ගන්න එපා. මම මේ කතාවෙන් මාව කැපී පෙන්නන්න හදනවා කියලා හිතන්නත් එපා. නමුත් මේක කිව යුතුයි කියලා මම හිතනවා. ඒ නිසා මේ අවස්ථාව මම ගන්නවා මගේ අදහස කියන්න. සභාපතිතුමනි, මම ඊයේ සභාවට ඇවිල්ලා ආපහු යනකොට අර බෝවත්තේ ජල කරාමය ළඟ නැවැත්තුවා. මොකද මම සාමාන්‍යයෙන් එනකොට කෑම එකක් අරන් එන්නේ. නවත්තනකොට එතන ලොකු කාඩ්බෝඩ් පෙට්ටියකුත් තිබුණා. ඒ වගේම තැන තැන විසි කරලා තිබුණා බියර් බෝතල් 10/12ක් විතර. අරක්කු බෝතල් කාලේ ඒවා තිබුණා. තව තැන තැන විසි කරපු කෑම කොළ තිබුණා. ඔය ස්ථානයේ අපේ බළන්ගොඩ අය විතරක් නෙවෙයි ගොඩක් අය සංචාරයේ යනකොට වතුර ටිකක් අරගෙන යනවා. මං ඊට පස්සේ එතන තිබුණු ඒ ටික අර කාඩ්බෝඩ් පෙට්ටියට දාගෙන ගෙදර ගෙනිහිල්ලා යට කළා. හැබැයි දැන් යන කොට මට පොඩි සැකයක් ඇතිවුණා මට බයයි මොකද මම මේවා ඇහිදිනවා දැක්කොත් හිතන්නේ වෙන දෙයක්. මම කොහොම හරි වතුර එකක් ගන්න එතන පැය බාගයක් විතර හිටියා. කවුරුත් නැති වෙලාවේ මම ඉක්මනින්ම අර

ටික කාඩ්බෝඩ් පෙට්ටියකට දාලා , බෝතල් ටිකත් ඒකට දාලා මගේ වීල් එකට දාගෙන මම ගෙදර අරන් ගියා. ඊට පස්සේ ඊයේ හවසම ඒ ටික යට කළා. ඉතින් සභාපතිතුමනි අර දැන්වීම් පුවරු සකස් කරනකොට, ඒවා සවි කරනකොට එම ස්ථානයේ එකක් සවි කරන්න කියලා මම ඉල්ලනවා. ඒ වගේම මේතැන් වල මේ විදියට කුණු බැහැර කරනවනම්, නීතිය අනුව කටයුතු කරනවා කියලත් සඳහන් කරන්න පුළුවන් නම් හොඳයි කියලා යෝජනා කරනවා. ගෙදර ගියාට පස්සේ මම හිතුවා නෝනා සද්දයක් දායි කියලා. නෝනට ගිහින් මම කිව්වා විස්තරේ මොකුත් කිව්වේ නෑ ඒක නිසා. හැබැයි මම ඒක කළේ කාටවත් පේන්න නෙවෙයි, අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙක් විදියට සියළු දෙනාගේ ගෞරවය ආරක්ෂා කරමින් තමයි කළේ. ඉතින් මම ඒක කිව්වෙත් අවිධිමත් ලෙස කසළ බැහැර කිරීමේ දැන්වීම් පුවරු එතන සවි කරන්න කියන ඉල්ලීම කරන්න ඕනි නිසා.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

අපේ න්‍යාය පත්‍රයේ නැති වුණාට දැනුම් දීම් 02ක් තියෙනවා කරන්න. එකක් තමයි බළන්ගොඩ නගරයට රාජ්‍ය ඔසුසළක් අනුමත වෙලා තියෙන්නේ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අදහසක් ආවා. දැන් ඒක සම්මත වෙලා තියෙන්නේ. ඒ අනුව රාජ්‍ය ඔසුසළක් බළන්ගොඩ ඉදිවෙනවා. ඒ වගේම අපිට කෙටි කාලයක් තුළ ධීවර සංස්ථාවට සම්බන්ධ මාළු වෙළඳසලක් බළන්ගොඩ නගරයේ ස්ථාපිත කළා. අපි දූපතක්. හැබැයි අපිට මුහුද ඒ තරම් දුර නෙවෙයි තියෙන්නේ. ඇත්තටම අපේ පාරිභෝගයන්ට අළුත් මාළු හම්බ වෙනවා අඩුයි. ඒක නිසා අපි ඒකත් කරලා තියෙනවා. ඊට පස්සේ දෙවන දැනුම් දීම තමයි හැමෝටම අදාළ වෙයි මේක. විශේෂයෙන්ම දහමාන වසමට. අර දියමළංකඳුර පාරේ පැතිබැම්ම ගලවගෙන ගිහින් තියෙනවා. ඒක මේ අප්‍රේල් මාසේ වැස්ස ආවාට පස්සේ ගලවගෙන ගියොත් එහෙම විශාල හානියක් වෙනවා ඒ ප්‍රදේශයේ ජනතාවට. මොකද යන්න එන්නවත් පාරක් තොටක් නැති වෙනවා. ඒ නිසා අපි රුපියල් මිලියන 80ක් වෙන් කරලා තියෙනවා. ළඟදීම අපි ඒකේ වැඩ පටන් ගන්නවා. අන්න ඒ පිළිබඳව සභාව දැනුවත් විය යුත් නිසයි දැනුම් දීම කළේ. හරි අපි එහෙනම් මේ මාසෙට අදාළ සභාව අවසන් කරනවා.

ඒ අනුව පෙ.ව.11.50ට සභාවේ කටයුතු අවසන් කරන ලදී.

ගමඇතිගේ ආරියදාස
සභාපති
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව